# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,467 - 2025 දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා - 2025.12.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1540 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 1541 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 දෙසැම්බර් 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1159- B 082732 — 5,403 (2025/10)
F 1 -

# පළාත් පාලන නිවේදන

## කාත්තන්කුඩි නගර සභාව

### 2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

**තීරණය**

කාත්තන්කුඩි නගර සභාවේ සභාපති එස්. එච්. එම්. අස්ෆර් වන මම (255 අධිකාරය) නගර සභා ආඥාපනතේ 184අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව

01. එම ආඥාපනතේ 166 වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය මහ නගර සභා ආඥාපනතේ 238(1) උපවගන්තිය අනුව කාත්තන්කුඩි නගරයේ පිහිටි සෑම නිශ්චල දේපළක 2025 වර්ෂයේ බල පැවැත්වූ වාර්ෂික වටිනාකම, 2026 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්,

02. අංක 2025/25 හා 2025.06.12 දිනැති සභා තීරණය අනුව සහ ගරු ආණ්ඩුකාරවරයාගේ අංක G/EPC/G/25/Ann.val දරන 20.11.2025 දිනැති අනුමැතිය අනුව පහත සඳහන් අනුපාතයට 2026 වර්ෂයේ සිට අය කිරීමටත්

03. නගර සභා ආඥාපනතේ 160(1) උපවගන්තියේ විධිවිධාන අනුව සෑම නේවාසික දේපළක වාර්ෂික වටිනාකමින් 8% ක වරිපනමක් පනවා අය කිරීමටත්,

04. නගර සභා ආඥා පනතේ 160(1අ) උපවගන්තියේ විධිවිධාන අනුව වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් 15% ක වරිපනමක් පනවා අය කිරීමටත් සහ

05. සෑම නිශ්චල දේපළක හිමියකු විසින්, නගර සභා අඥාපනතේ 160(1) උපවගන්තියේ විධිවිධාන අනුව නගර සභාවට අයවිය යුතු වාර්ෂික වරිපනම්, 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් නගර සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට තීරණය කරමි.

එස්. එච්. එම්. අස්ෆර්,
සභාපති,
නගර සභාව,
කාත්තන්කුඩි.

2025 නොවැම්බර් මස 25 දින,
කාත්තන්කුඩි නගර සභා කාර්යාලයේ දී ය.

12-249

---

## මහරගම නගර සභාව

### නගර සභා ආඥාපනත යටතේ (255 අධිකාරය) 50 හා 52 වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 අධිකාරයේ 50 හා 52 වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්යක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එස්. එම්. සමන් සමරකෝන්,
සභාපති,
මහරගම නගර සභාව.

2025 නොවැම්බර් මස 28 දින,
මහරගම නගර සභා වේ දී ය.

**මහරගම නගර සභාව**

**ඇමුණුම 1**

| *මාර්ගයේ නම* | *ග්‍රාම සේවා වසම* | *සැලසුම් අංකය දිනය හා මිනින්දෝරු මහතාගේ නම* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *මාර්ගයේ ආරම්භය (වරිපනම් අංක)* | *මාර්ගයේ අවසානය (වරිපනම් අංක)* |
|---|---|---|---|---|---|---|
| මහරගම පන්සල පටුමග අතුරු මාර්ගය | 528ඒ දඹහේන | 2013.08.15<br>බී. යූ. එස්. ප්‍රනාන්දු<br>2451 - ලොට් 4යි | අඩි 40 | අඩි 12 | 60/47 සහ 66/22 | 60/45 |
| | | 1961.01.19<br>ඩී. ජේ. නානායක්කාර<br>626 - ලොට් 31 න් කොටසක් | අඩි 152 | අඩි 20 | පන්සල පටුමග | 66/22 |

12-199

---

**බොරලැස්ගමුව නගර සභාව**

2026 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

255 වැනි අධිකාරය වන 139 අංක 61 දරන නගර සභා ආඥාපනතේ අංක 165ඇ (1) වගන්තිය යටතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් වලින් එනම් සම්පූර්ණ ඉඩමෙන් ගොඩනැගිලි කිසිවක් හෝ කිසිදු ගොවිතැන් කටයුත්තක් සඳහා ඉඩමෙන් යටවී ඇති බිම් ප්‍රමාණය 40% ට අඩු වන්නේ නම් ඉඩමේ/භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 0.2% බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට, 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 28 දින මාසික මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනා අංක 5.15 යටතේ සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ ඔක්තෝබර් මස 28 වැනි දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

255 අධිකාරය 139 අංක 61 දරන නගර සභා ආඥාපනතේ අංක 165ඇ (1) වගන්තිය යටතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් වලින් එනම් සම්පූර්ණ ඉඩමෙන් ගොඩනැගිලි කිසිවක් හෝ කිසිදු ගොවිතැන් කටයුත්තක් සඳහා ඉඩමෙන් යට වී ඇති බිම් ප්‍රමාණය 40% ට අඩු වන්නේ නම් ඉඩමේ/භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 0.2% බද්දක් 2026 වර්ෂයට පනවා අය කරගත යුතු බවට යෝජනා කරමි.

12-224

---

**එරාවූර් නගර සභාව**

2026 වර්ෂ සඳහා දේපල බද්ද අය කිරීම සඳහා වූ දැන්වීම

1939 වර්ෂයේ අංක 255 දරන නගර සභා ආඥාපනතේ 160, 166, 170 වගන්ති යටතේ බලතල අනුව එරාවූර් නගර සභා පරිපාලන සීමාවන් තුළ පිහිටි සියලුම දේපල මත පහත සඳහන් විස්තර අනුව 2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන දේපළ තක්සේරු කිරීමේ දී හිස් ඉඩම් සඳහා 10% රජයේ දේපළ හා වත්කම් වාණිජ පැවැත්වෙන ඉඩම් සඳහා 8% වාසස්ථාන ඉඩම් සඳහා 7%, ඉදිරි 2026 වර්ෂය සඳහා

දේපළ බද්ද ගාස්තු අය කරන බව 2025.11.25 දින පැවැත්වූ මහජන නියෝජිතයින්ගේ මාසික රැස්වීමේ දී තීරණ අංක 07 අනුව ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

1. කොට්ඨාස 1 සිට 10 දක්වා 2026 වර්ෂයේ මාර්තු මස 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 දිනවලදී හෝ ඊට පෙර හෝ දේපළ බද්ද ගාස්තුව හතර කාර්තුව වාරික වශයෙන් සමාන මුදල් ලෙස ගෙවිය යුතුයි.

   නැතහොත් 2026 වර්ෂ මාර්තු මස 31 දිනට පෙර එම වර්ෂය සඳහා වූ මුළු බද්ද ගාස්තුව සම්පූර්ණයෙන් ගෙවන්නේ නම් එම වර්ෂයට අදාළ වර්ෂය සඳහා කිසිදු දඩ මුදල්වලින් නිදහස් විය හැක.

2. නගර සභා ආඥාපනතේ 160(5) වගන්තිය යටතේ පහත සඳහන් වට්ටම් අනුමත කර ඇත.

   වර්ෂ 2026 ජනවාරි මස 31 දින හෝ ඊට පෙර වාර්ෂික බද්ද සම්පූර්ණයෙන් ගෙවන්නේ නම් 10% ක වට්ටමක් හා සෑම කාර්තුවට අදාළ දේපළ බද්ද අදාළ කාර්තුවේ පළමු මාසයේ අවසාන දිනට පෙර ගෙවන්නේ නම් 5% ක වට්ටමක් ලබා දෙනු ලැබේ.

තවද, කාර්තුවට වට්ටම් ලබා දෙන සහන කාලය හා දඩ නියම කරන කාලය පහත පරිදි

| *කාර්තු* | *ගෙවිය යුතු අවසන් දිනය* | *5% ක වට්ටමක් ලබා දෙනු ලබන සහනයේ අවසන් දිනය* | *දඩුවම් ගණන් කරනු ලබන ආරම්භක දිනය* |
|---|---|---|---|
| 1 වන කාර්තුවකට | වර්ෂ 2026 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා | 2026.01.31 | 2026.04.01 |
| 2 වන කාර්තුවකට | වර්ෂ 2026 අප්‍රේල් 01 සිට ජුනි 31 දක්වා | 2026.04.30 | 2026.07.01 |
| 3 වන කාර්තුවකට | වර්ෂ 2026 ජුලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා | 2026.07.31 | 2026.10.01 |
| 4 වන කාර්තුවකට | වර්ෂ 2026 ඔක්තෝබ 01 සිට දෙසැම්බර් 31 දක්වා | 2026.10.31 | 2027.01.01. |

ඉහත සඳහන් කළ කාර්තුව සඳහා දඩ ගණනය කළ යුතු ආරම්භ දිනයේ සියලුම වත්කම් දඩුවම් පහත පරිදි නියම කෙරේ.

හිස් ඉඩම් හා වාසස්ථානය ඉඩම් සඳහා 15% රාජ්‍ය වත්කම් හා වානිජ පැවැත්වෙන ඉඩම් පිළිබඳ 20%, වැඩිදුරට දඩ මුදල අය කරනු ලබන බව කාරුණිකව දන්වමි.

මේ සම්බන්ධව වැඩි විස්තර සඳහා එරාවූර් නගර සභාව පැමිණි කාර්යාල වේලාවන් තුළ ලබා ගත හැකිය.

එම්. එස්. නලීම්,
සභාපති,
එරාවූර් නගර සභාව.

දුරකථන අංකය : 065 224 1295

12-123

---

**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව**

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි අංක 52 පුංචිඅප්පුජදුර, අංක 51 පුඩුවීගම, අංක 48 මත්තල, යන ග්‍රාම නිලධාරි වසම් 03 දියුණු කළ ප්‍ර දේශ වශයෙන් පිළිගත යුතු බවට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව විසින් 2025.08.20 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 14 යටතේ සම්මත කරන ලද යෝජනාව එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් ප්‍රාදේශීය පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත ලැබී ඇති බලතල යටතේ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත්

පාලන සහකාර කොමසාරිස් හත්තොටුව ගමගේ සුමුදු ලක්සරා වන මා විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ජී. සුමුදු ලක්සරා,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්,
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

2025 නොවැම්බර් මස 04 දින,
හම්බන්තොට පළාත් පාලන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තිය හා ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආදායම් තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට හා මහජනතාවට සපයනු ලබන සේවාවන් පුළුල් කිරීම හා දේපලවලට වැඩි වටිනාකමක් ලබා දෙමින්, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අංක 52 දරන පුංචිඅප්පුජඳුර, අංක 51 දරන පඬිවිගම හා අංක 48 දරන මත්තල යන ග්‍රාම නිලධාර වසම් තුන (03) දියුණුගම් ප්‍රදේශ ලෙසට ප්‍රකාශයට පත්කර. වරිපනම් අය කිරීම සඳහා හම්බන්තොට පළාත් පාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ සභාපති, හෙට්ටි ආරච්චිගේ නිරෝෂ් දිමුතු ප්‍රසංග වන මම විසින් මෙම ගරු මහා සභාවට යෝජනා කරමි.

| | | | |
|---|---|---|---|
| අංක 52 - පුංචිඅප්පුජඳුර | *උතුර* | - | පඬිවිගම |
| | *නැගෙනහිර* | - | නව නගරය |
| | *බටහිර* | - | පඬිවිගම |
| | *දකුණ* | - | වීරවිල්ආර |
| අංක 51 - පඬිවිගම | *උතුර* | - | බෝගහවැව |
| | *නැගෙනහිර* | - | පුංචිඅප්පුජඳුර |
| | *බටහිර* | - | මත්තල |
| | *දකුණ* | - | මුවන්වැව |
| අංක 48 - මත්තල | *උතුර* | - | බෝගහවැව |
| | *නැගෙනහිර* | - | මුවන්වැව |
| | *බටහිර* | - | පහල මත්තල |
| | *දකුණ* | - | තම්මැන්නාව (හම්බන්තොට ප්‍රා. සභාවට අයත්). |

12-198

---

**ගාල්ල මහා නගර සභාව**

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

මහා නගර සභාව විසින් 2025 වර්ෂයේ නොවැම්බර් මස 13 දින පැවති මහා සභාවේ තීරණ අංක 06(10) සහ සම්මුතිය අනුව පහත දැක්වෙන යෝජනා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. 2026 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් බදු 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ගාල්ල මහා නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

02. 2026 වර්ෂය සඳහා සම්පූර්ණ වරිපනම් බදු 2026 වර්ෂයේ ජනවාරි මස 31 දින හෝ එදිනට පෙර ගාල්ල මහා නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද; එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට පෙර ගාල්ල මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

03. ඉහත සඳහන් කාල සීමාව තුළ දී වරිපනම් බදු නොගෙවන අදාළ මුඩු ඉඩම් හා වාසස්ථාන වෙනුවෙන් සියයට පහළොවක (15%) වරෙන්තු ගාස්තුවක් ද,, මුඩු ඉඩම් හා වාසස්ථාන නොවන අනෙකුත් දේපළ වෙනුවෙන් සියයට විස්ස (20%) ක වරෙන්තු ගාස්තුවක් ද අය කරනු ලැබේ.

සුනිල් ගමගේ,
නගරාධිපති,
මහා නගර සභාව - ගාල්ල.

2025 නොවැම්බර් මස 13 වැනි දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

252 වැනි අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වගන්තිය (1) උපවගන්තියෙන් මහා නගර සභාව වෙත කරන ලද නියමය ප්‍රකාර, ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශ ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙවල්වල වාර්ෂික තක්සේරු වටිනාකම වශයෙන් 2025 වර්ෂය සඳහා පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම 2026 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම වශයෙන් පිළිගැනීමටත්,

එකී, මහා නගර සභා ආඥා පනතේ 230 වගන්තියේ (1) උප වගන්තියෙන් ගාල්ල මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමින්,

*(අ)* නේවාසික ස්ථාන මත සියයට හත (7%) ක වරිපනමක් ද; සහ

*(ආ)* වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට දොළහ (12%) ක වරිපනමක් ද;

*(ඇ)* අනෙකුත් සියලුම රජයේ දේපළ හිස් ඉඩම් සඳහා සියයට විසිදෙක (22%) ක වරිපනමක් ද 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්; සහ

ඒ වරිපනම් එකී මහා නගර සභා ආඥාපනතේ 230 වගන්තියේ (2) උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ 2026 මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30, හා දෙසැම්බර් මස 31 වැනි දින වලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් ගාල්ල මහා නගර සභාවට ගෙවීමට විධාන කිරීමටත් ගාල්ල මහා නගර සභාව යෝජනා කරන්නීය.

12-200

---

**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය - ගෝඝාතකාගාරය සඳහා විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ආණමඩුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය හා කර්තව්‍ය ඉටු කරන, ආණමඩුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. ජේ. එම්. එම්. එස්. ජයසුන්දර වන මම, එකී පනතේ 102 වගන්තියේ සහ 272 අධිකාරිය වූ ගෝ ඝාතක ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍ර දේශයේ කඩයන්දළුව, ආඩිගම යන ස්ථානයෙහි ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා මාගෙන් අවසර ඉල්ලා සිටින හෙයින්, ඒ සම්බන්ධව යම් විරෝධතාවයක් ඇත්නම් 2025.12.19 දිනට ප්‍රථම ආණමඩුව ප්‍රාදේශීය සභාව වෙත ලිඛිතව භාර දීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිවේදනය කරමි.

එච්. ජේ. එම්. එම්. එස්. ජයසුන්දර,
ලේකම්, බලතල ක්‍රියාත්මක කරන කාර්යය,
කර්තව්‍ය ඉටුකරන නිලධාරී,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 27 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

12-205

## බණ්ඩාරවෙල මහා නගර සභාව

### 2026 වර්ෂය සඳහා අයවැය ලේඛනය ප්‍රසිද්ධ කිරීම

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 212 වගන්තියෙන් නියම කර ඇති පරිදි මා විසින් බණ්ඩාරවෙල මහා නගර සභාවට අදාළව 2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද අයවැය ලේඛනය ප්‍රදේශවාසී මහජනතාවගේ දැන ගැනීම පිණිස පරීක්ෂා කර බැලීම සඳහා 2026.12.03 දින සිට මෙම මහා නගර සභා කාර්යාලය, මහජන පුස්තකාලය සහ වාණිජ මධ්‍යස්ථානයේ තබා ඇති බැව් මහා නගර සභා ආඥාපනතේ 212(ආ) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. එම්. එස්. ඩී. විශ්ව වික්‍රම,
නගරාධිපති,
මහා නගර සභාව,
බණ්ඩාරවෙල.

12-273

---

## තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

### 2026 වර්ෂය සඳහා එළ ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාමට බලපත්‍ර ලබා දීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ නොවැම්බර් මස 20 දින පැවති මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 2.1.4 යටතේ 1893 අංක 9 දරන ගෝඝාතක ආඥාපනත හා සංශෝධන පනත යටතේ එහි අංක 7(1) හි පරිදි එළහරක් මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අය විසින් 2026 වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බව මින් මහජනයාට නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. සී. කේ. දේදුනුපිටිය,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2025 නොවැම්බර් මස 20 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

එකී ස්ථානයට එබඳු බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කරනු කැමති තුම්පනේ ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත පදිංචි තැනැත්තන් විසින් එසේ විරුද්ධත්වයට තිබෙන කරුණු පිළිබඳව ලිඛිත ප්‍රකාශයක් පිටපත් දෙකකින් (2) යුක්තව මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

එළගව මස් වෙළඳ සැල පවත්වාගෙන යාමට ඉල්ලුම් කරන ස්ථානයේ විස්තර ඇතුළත් වගුව

| *අනු. අංකය* | *එළගවමස් වෙළඳසැල පවත්වාගෙන යාමට ඉල්ලුම්කළ තැනැත්තාගේ නම හා ලිපිනය* | *එළ ගවමස් ලබා ගන්නා ස්ථානය හා එම අයිතිකරුගේ නම හා ලිපිනය* | *එළගව මස් වෙළඳසැල පවත්වාගෙන යාමට අදහස් කරන ස්ථානයේ ලිපිනය හා හඳුනා ගැනීමේ විස්තරය* | *ග්‍රාම නිලධාරි වසම* |
|---|---|---|---|---|
| 01 | එස්. එම්. රියාස් මයා, නො. 67/1,<br>දෙහිදෙණිය මඩිගේ,<br>හතරලියද්ද<br>(ජා.හැ.අ. 781261432 V) | ඒ. කේ. එම්. රිස්වාන් මයා,<br>හෙට්ටිගොඩ,<br>කහපත්වල,<br>(ජා.හැ.අ. 683431796 V) | හතරලියද්ද කොටිකාම්බ මංසන්ධියේ ඇති නයිම් හජ්ජියාර් මාවතේ ජුම්මා පල්ලිය ඉදිරිපිට දෙහිදෙණිය මඩිගේ එළ ගවමස් වෙළඳසැල | අංක 386-දෙහිදෙණිය මඩිගේ |

| අනු. අංකය | එළගවමස් වෙළඳසැල පවත්වාගෙන යාමට ඉල්ලුම්කළ තැනැත්තාගේ නම හා ලිපිනය | එළ ගවමස් ලබා ගන්නා ස්ථානය හා එම අයිතිකරුගේ නම හා ලිපිනය | එළගව මස් වෙළඳසැල පවත්වාගෙන යාමට අදහස් කරන ස්ථානයේ ලිපිනය හා හඳුනා ගැනීමේ විස්තරය | ග්‍රාම නිලධාරී වසම |
|---|---|---|---|---|
| 02 | එම්. එස්. එම්. නජීම් මයා,<br>අංක 319,<br>මඩිගේ,<br>ගලගෙදර<br>(ජා.හැ.අ. 812332996 V) | ඒ. එස්. එම්. බුර්හාන්,<br>වැඋඩ,<br>පරගහදෙණිය | ගලගෙදර මඩිගේ පෙතිගෙවෙල මංසන්ධිය ඉදිරිපිට ඇති අංක 319 දරන එළ ගවමස් අලෙවි සැල | ගලගෙදර මඩිගේ දකුණ |
| 03 | ඒ. කේ.එම්. රිස්වාන් මයා,<br>බෙට්ටියගොඩ,<br>කහපත්වල,<br>(ජා.හැ.අ. 683431796 V) | එම්. ජේ. එම්. සලීම්,<br>නුවර පාර,<br>පරගහදෙනිය | 9 කණුව සිට හතරලියද්ද පාරේ කි. මී. 1/2 ක් පැමිණ බෙට්ටියගොඩ, කහපත්වල, එළ ගවමස් වෙළඳසැල | අංක 380,<br>මීගහහේන,<br>දකුණ |
| 04 | එම්. එෆ්. එම්. රිෆාක් මයා,<br>අංක 226,<br>නිදහස් පටුමග,<br>මඩිගේ,<br>ගලගෙදර<br>(ජා.හැ.අ. 721541576V) | යූ. එල්. එම්. ලාෆීර්,<br>වාරියපොල,<br><br>එම්. එෆ්. නිරෝෂ්,<br>මොහොමඩ්,<br>නිකදලුපොත | ගලදෙර මඩිගේ ඉන්ධන පිරවුම්හල අසල ඉදිරිපිට ඇති අංක 367 දරන එළ ගවමස් වෙළඳ සැල | අංක 369,<br>ගලගෙදර<br>බටහිර |

12-122

---

**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත

පාලින්දනුවර ප්‍රාදේශීය සභාව මගින් ටෙන්ඩර් කර බදුරලිය ඉරුදින පොළ භූමියේ එළ හරක් මස් කඩයක් පවත්වාගෙන යාමට 2025.10.07 දින අංක (ඊ) 1.12 යටතේ මහ සභාවේ යෝජනාවක් සම්මත වී ඇත. ඒ සම්බන්ධයෙන් පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි තැනැත්තන්ගේ විරෝධතාවක් පවතී නම් එම විරෝධතාවයට හේතු වන කරුණු පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් පිටපත් දෙකකින් යුක්තව මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කර දින 14ක් තුළ මා වෙත ඉදිරිපත් කරන ලෙස ගෝ ඝාතක ආඥාපනතේ 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| අනු. අංකය | බදු දීමනා කරු | එළහරක් මස් අලෙවි සැල පවත්වාගෙන යන ස්ථානය |
|---|---|---|
| 01 | සභාපති, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව | ඉරුදින පොළ භූමියෙහි පිහිටි එළ හරක් මස් අලෙවි සැල |

ජී. කේ. ඩී. සනත් ජීවානන්ද,
සභාපති,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

.

2025 නොවැම්බර් මස 27 දින,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දීය.

12-181

**අම්පාර නගර සභාව**

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

255 අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ අම්පාර නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අම්පාර නගර සභාවේ සභාපති වන මා විසින් 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 16 වන දින පවත්වන ලද අම්පාර නගර සභා රැස්වීමේ තීරණ අංක 2025/10/16/5-XIX යටතේ පහත දැක්වෙන තීරණය ගත බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. ජී. ඉන්දික උපතිස්ස විජේවික්‍රම,
සභාපති,
අම්පාර නගර සභාව.

2025 ක් වූ දෙසැම්බර් මස 02 වැනි දින,
අම්පාර නගර සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

255 අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 160(1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, අම්පාර නගර සභා බල ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළකම 2019 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම 2026 වර්ෂයේ වටිනාකම ලෙස පිළිගැනීමටත්, එකී 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 160 වගන්තියේ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, අම්පාර නගර සභා ප්‍ර දේශයේ පිහිටි දේපළක වාර්ෂික වටිනාකමින්,

(1) හිස් ඉඩම් සහ නේවාසික ස්ථාන මත සියයට හත (7%) ක වරිපනම් බද්දක් ද,

(2) වෙළඳ හෝ වානිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට එකොළහක (11%) වරිපනම් බද්දක් ද, 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්,

තවද, 2026 වර්ෂයේ පහත උපලේඛනයේ සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද අම්පාර නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද, 2026 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල අම්පාර නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද, අම්පාර නගර සභා අරමුදල වෙත ලබා දිය යුතු බවටත් තීරණය කරමි. එමෙන්ම, වරිපනම් අය කිරීම සම්බන්ධයෙන් තක්සේරු විරෝධතා පවතින්නේ නම් එම විරෝධතා 2026.01.31 වන දිනට ප්‍රථමව අම්පාර නගර සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවද දන්වමි.

**උපලේඛනය**

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2026.03.31 | 2026.01.31 |
| දෙවන කාර්තුව | 2026.06.30 | 2026.04.30 |
| තුන්වන කාර්තුව | 2026.09.30 | 2026.07.31 |
| හතරවන කාර්තුව | 2026.09.31 | 2026.10.31 |

12-157

## මහර ප්‍රාදේශීය සභාව

### 2026 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (i) යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා නියම වියයුතු බවට යෝජනා කරමි.

**උපලේඛනය**

| | *I තීරය* *කර්මාන්තය* | *II තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථා* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථා* | *රු. 1,500 ඉක්මවන අවස්ථා* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය නිපදවීම හෝ වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | ක්ලච් ප්ලේට්, බ්‍රේක් ලයිනර් අලුත්වැඩියා කරන, අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | ලාම්පු කවර නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | යකඩ ඇණ, කම්බි ඇණ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ඇලුමිනියම් ෆැබ්රිකේටින් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | ස්ක්‍රීන් මුද්‍රණය කරන ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | බිම් මල් වෙළෙඳාම් කරන ස්ථානයක්/වගා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ඇන්ටනා ඒරියල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ගෑස් උදුන් අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ත්‍රී වීලර් රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | වාහන විදුලි කාර්මික වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | දර මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | කෘෂි උපකරණ වෙළෙඳසලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | වීදුරු භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ට්‍රැවලින් බෑග් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | පින්තූර රාමු කරන හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ආයුර්වේද බෙහෙත් වර්ග පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | අත් යන්ත්‍ර මගින් සපත්තු නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ඉන්ටර්නෙට් පහසුකම් සපයන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *I තීරය*<br>*කර්මාන්තය* | *II තීරය*<br>*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 750 නොඉක්මවන අවස්ථා*<br>*රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථා*<br>*රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථා*<br>*රු. ශත* |
| 23. අත් යන්ත්‍ර පෙහෙකම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. අභ්‍යාස පොත් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. පරිගණක අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. කාර්යාල හැඳුනුම්පත් සඳහා පටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. පොලිතීන් සහ පොලිතීන් බෑග්වල අකුරු සහ ලාංඡන මුද්‍රණ කටයුතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. කඩදාසි කවර නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. කඩදාසි උපයෝගී කරගෙන භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. විදුලි කාර්මික වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. ගුවන් විදුලිය, රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ වැඩපලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 33. යතුරු ලියන රෝනියෝ යන්ත්‍ර හා දුරකථන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. විදුලි මෝටර් එතීම කරන වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. කම්මලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. සංගීත භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. දැන්වීම්, නාම පුවරු අඳින හෝ රබර් සීල් සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. බීඩි, සුරුට්ටු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. බිම්මල් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. මදුරු දැල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. ඉදල්, කොසු, හැඳි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. වීදුරු ටැංකි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. පිත්තල සරනේරු ඔක්සිකරණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. ෆයිබර් ග්ලාස් අච්චු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. විකිණීම සඳහා කුළු බඩු පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. යකඩ කම්බි ආදියෙන් විවිධ නිෂ්පාදන, නිර්මාණ භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. පාවහන් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම (වතුර මෝටර්, විදුලි ස්තිරික්ක, විදුලි උඳුන් ආදිය) | 500 0 | 750 0 | 1,000 0 |
| 50. ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. පොත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. මහන මැෂින් අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 53. ග්ලවුස් (අත් මේස්) පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. පිත්තල භාණ්ඩ පොලිෂ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 55. ඇඟළුම් උපාංග මිලට ගැනීම සහ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. ටයිප් සෙටින්, ග්‍රැෆික් කර්මාන්ත ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. රේගු භාණ්ඩ නිෂ්කාශනය කිරීම හා ඉදිරිපත් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. යන්ත්‍ර උපකරණ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I තීරය* *කර්මාන්තය* | *II තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු. 750 නොඉක්මවන අවස්ථා* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථා* | *රු. 1,500 ඉක්මවන අවස්ථා* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 59. ප්ලාස්ටික් බට නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. නිවාස වයරින් කිරීම, වතුර බට එලීම සහ ආරක්ෂක කැමරා පද්ධතියක් සවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. උද්‍යාන අලංකරණය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. විසිතුරු තායිවන් නිර්මාණ කිරීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 63. සූර්යබල ශක්තියෙන් විදුලිය නිපදවන උපකරණ නිපදවීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 64. ලිපිකවර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. හඳුන්කූරු නිපදවීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 66. ගිණි ආරක්ෂණ පද්ධති සවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. නිවාස/ගොඩනැගිලි ඉදිකර අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. නිවාස වහල/කැනපි නිර්මාණය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. ස්ටිකර් කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. ගොඩනැගිලි/නිවාස පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 71. ගොඩනැගිලි කඩා ඉවත් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 72. එම්බ්‍රොයිඩර් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. අත්කම් නිර්මානය | 500 0 | 750 0 | 1,000 0 |
| 74. ඇලුමිනියම් දොර ජනෙල් සවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 75. ළදරු නිෂ්පාදන සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 76. කැලැන්ඩර් මුද්‍රණය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. ෆලයිවුඩ් බෝඩ් සැකසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. යතුරු පැදි අලුත් වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 79. මහන මැෂින් අලුත් වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 80. කේෂ වර්ණාලේප ඇසුරුම් කිරීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 81. ශල්‍ය ගෝස් ඇසුරුම් කිරීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 82. ආරක්ෂිත දැල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 83. ආරක්ෂිත ඇඳුම් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 84. ඉන්ජෙක්ෂන් මෝල්ඩින් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |

12 - 276/1

---

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වැනි උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (ii) යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

**ඉහත කී යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) වන උප වගන්තිය යටතේ මහර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යවෙළඳ ව්‍යාපාරයක් මහර ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2025 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට යෝජනා කරමි.

**උපලේඛනය**

| | *I තීරය* | *II තීරය* |
|---|---|---|
| *අනු. අංකය* | *2025 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *රු. ශත* |
| 01 | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | අයකිරීමක් නැත |
| 02 | රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 03 | රු. 12,001 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 04 | රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| 05 | රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 06 | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

12-276/2

---

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 34(1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (iii) යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

**ඉහත කී යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1290 හා 2003-05-23 දිනැති *ගැසට් පත්‍රය* යටතේ මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2025 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යොක්ෂණය 2026 වර්ෂ සඳහා තක්සේරුව/සත්‍යොක්ෂණය ලෙස තීරණය කළ යුතු බවත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව අනුව වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) වාර්ෂික වරිපනම් බද්දක් නියම වියයුතු බවටත්,

තව ද, 2026 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද මහර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2026 ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, පහත උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල මහර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක් (5%) වට්ටමක් ද මහර ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවටත් මම යෝජනා කරමි.

නියමිත කාර්තුව තුළදී බද්ද නොගෙවන අයගෙන් එකී පනතේ (161) අ වගන්තියෙන් දක්වා ඇති ආකාරයට වරෙන්තු නිකුත් කිරීමෙන් පසුව එක් එක් කාර්තුව සඳහා හිස් බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් සියයට පහළොවක (15%) වරෙන්තු ගාස්තුවක් ද, වෙළඳ හා වාණිජ දේපළ වෙනුවෙන් සියයට විස්සක (20%) වරෙන්තු ගාස්තුවක් ද අය කළ යුතු යැයි මම යෝජනා කරමි.

**උපලේඛනය**

| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* |
|---|---|---|
| *කාර්තුව* | *ඉහත කී උපලේඛනය ගෙවිය යුතු අවසාන දිනය* | *5%ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
| පළමු කාර්තුව | 2026.03.31 | 2026.01.31 |
| දෙවන කාර්තුව | 2026.06.30 | 2026.04.30 |
| තුන්වන කාර්තුව | 2026.09.30 | 2026.07.31 |
| හතරවන කාර්තුව | 2026.12.31 | 2026.10.31 |

12 - 276/3

---

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට වාහන සහ සතුන් පිළිබඳ බදු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 148 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛණයේ දැක්වෙන ආකාරයට මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (iv) යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

**ඉහත කී යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 148 වගන්ති යටතේ මහර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේ පහත උප ලේඛනයේ 01 තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එකී උපලේඛනයේ 02 තීරුවේ නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා ගෙවිය යුතු යන අතර 148 (3) වගන්තියට අනුව මෙම බදු මුදල ගෙවිය යුතු බවට මෙයින් යෝජනා කරමි.

උපලේඛනය

| *01 තීරුව* | *02 තීරුව* *රු. ශත* |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| සෑම බයිසිකලයක්, ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| (අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 00 |
| (ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4 00 |
| සෑම කරත්තයක් සඳහා | 20 00 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10 00 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 00 |
| සෑම ඇතකු සඳහා | 50 00 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

මෙම උපලේඛනයේ'වෙළෙඳ කාර්යය' යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 276/4

---

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 149 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2026 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (v) යටතේ ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කරමි.

**ඉහත කී යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙ හි 1 වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයන්හි 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇති අනුමත කර ඇති පිළිගෙන ඇති හෝ පිළිගෙන නැති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළ ක්වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2025 වර්ෂයේ ආදායමින් ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

***පළමු උපලේඛනය***

| | *I තීරුව* | *II තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු අංකය* | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථා* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථා* | *රු. 1,500 ඉක්මවන අවස්ථා* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| **පීඩාකාරී ව්‍යාපාර :** | | | | |
| 01. | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | සම් පදම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | සම් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා) | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | ඡායාරූප ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු අංකය | I තීරුව<br>බලය දෙනු ලබන කාර්යය | II තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම<br>රු. 750 නොඉක්මවන අවස්ථා<br>රු. ශත | <br><br>රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථා<br>රු. ශත | <br><br>රු. 1,500 ඉක්මවන අවස්ථා<br>රු. ශත |
|---|---|---|---|---|
| 06. | පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | කරවල, ලුණු මාළු, ජාඩි කිලෝග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | පොල්කටු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | සබන් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | වේවැල් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | රසකැවිලි වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | පොල්ලෙලි පෙඟවීම හෝ පල් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර) | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | දත් බුරුසු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | රා එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| – 29. | සෝඩා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | සම් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග, කුළු බඩු හෝ කිරි පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ඉටිපන්දම් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | කපුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | රෙදි සෝදන නිල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ලාකඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | පාසල් රටහුණු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | ටයර් නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | සිමෙන්ති කිලෝග්‍රෑම් 1,000ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු අංකය | *I තීරුව* බලය දෙනු ලබන කාර්යය | *II තීරුව* පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථා රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථා රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථා රු. ශත |
|---|---|---|---|---|
| 44. | සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | ධාන්‍ය හෝ මාංශ භෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | මනාලියන් හැඩගැන්වීම, කොණ්ඩා මෝස්තර හා උපකරණ දෙන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | බීරළු කැපීම හෝ ලී කැටයම් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | මල් ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | සම්භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | කුකුළු කෑම හෝ සත්ව ආහාර අලෙවි සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | ලෝහ යොදා ගනිමින් ගෘහ භාණ්ඩ නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | තේ ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | කරවල වෙළඳසලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | කොහු හෝ වෙනත් කෙඳිවලින් භාණ්ඩ නිපදවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | සේවකයින් 25 ට අඩු ඇඟළුම් කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | බැටරි ආරෝපණය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

**දෙවන උපලේඛනය**

*අන්තරාදායක ව්‍යාපාර :*

| | | | | |
|---|---|---|---|---|
| 01. | තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | මුද්‍රණාලයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | දර ගබඩාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පොල් තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු අංකය | I තීරුව<br>බලය දෙනු ලබන කාර්යය | II තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම<br>රු. 750 නොඉක්මවන අවස්ථා<br>රු. ශත | <br><br>රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථා<br>රු. ශත | <br><br>රු. 1,500 ඉක්මවන අවස්ථා<br>රු. ශත |
|---|---|---|---|---|
| 14. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | දැව ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |

## තෙවන උපලේඛනය

*පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :*

| | | | | |
|---|---|---|---|---|
| 01. | රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අළුහුණු ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | වාත්තු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | පැට්‍රෝල්, ඩීසල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

| | | | | |
|---|---|---|---|---|
| 21. | විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |

**හතරවන උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| 01. | බත්කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | කිරිපට්ටි හා කිරි වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | ආහාර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | අයිස් කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | සිසිල්බීම කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ලොන්ඩරි | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | ගව ගාල් | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | ඝාතක මඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | පොදු වෙළෙඳ සැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කොණ්ඩා සැකසීම සැලුන්හල් සහ බාබර් සාප්පු | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | හෝටල් සහ ලැගුම්හල් | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | භෝජනශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | මාළු වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | සංචාරක වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

12 - 276/5

---

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (vi) යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පැවරී ඇති බලතල අනුව මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම යෝජනා කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පැවරී ඇති බලතල අනුව 2016.09.15 දිනැති අංක 1985 දරන IV (ආ) කොටස පළාත් පාලන ගැසට් නිවේදනයෙන් වැළඳගෙන ඇති 2015.12.28 දිනැති අංක 1947/6 දරන IV (අ) කොටස පළාත් සභා *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රධාන මාර්ගයට, අතුරු මාර්ගයට, පළාත් සභා ප්‍රාදේශීය සභා හෝ පෞද්ගලික මාර්ගයට පෙනෙන පරිදි පුවරු, බැනර්, කටවුට්, ඇලුමිනියම් තහඩු, යකඩ, පොලිතීන් රෙදි හෝ කොළවල ඇඳීමෙන් ද, නොමැති නම් ගැල්වනයිස් යකඩ යොදා සකස් කරන ලද දැන්වීම් පුවරුවක් ද නිවසක, කඩයක, හෝටලයක, බිත්තියක, තාප්පයක ආදී ස්ථානයක, අකුරු හෝ රූප යොදා යම් වෙළෙඳ ස්ථානයක්, වෙළෙඳ භාණ්ඩයක්, ව්‍යාපාරයක් සඳහා කරන ප්‍රචාරක දැන්වීමක් ද වෙළෙඳ ප්‍රදර්ශනයක, සැණකෙළියක ආදී උත්සව අවස්ථාවන්හි දී යොදන විශේෂ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍ර මගින් ලද බලය යටතේ මිස කරනු නොලැබිය යුතු අතර, ඒ සඳහා පහත උපලේඛනයේ දැක්වෙන පරිදි බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂයට පැනවිය යුතු බවට මම යෝජනා කරමි.

*උපලේඛනය*

| *අනු අංකය* | *පුවරුවේ ස්වභාවය* | *වර්ග මීටර් ප්‍රමාණය* | *ගාස්තුව රුපියල්* | | |
|---|---|---|---|---|---|
| | | | *මාස 03 ට අඩු* | *මාස 03 හෝ 06 අතර* | *වසරක්* |
| 01 | කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම | 1 ට අඩු | 250 | 350 | 500 |
| | | 1 ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින් | | |
| 02 | රෙදි, ඩිජිටල් බැනර් සඳහා | 3 ට අඩු | 250 | 350 | 500 |
| | | 3 ට වැඩි | 3 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින් | | |
| 03 | තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1 ට අඩු | 500 | 750 | 1,000 |
| | | 1 ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින් | | |
| 04 | විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1 ට අඩු | 500 | 750 | 1,000 |
| | | 1 ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින් | | |
| 05 | ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1 ට අඩු | 250 | 350 | 500 |
| | | 1 ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින් | | |
| 06 | ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1 ට අඩු | 250 | 350 | 500 |
| | | 1 ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින් | | |
| 07 | විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1 ට අඩු | 750 | 850 | 1,000 |
| | | 1 ට වැඩි | 1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින් | | |

12 - 276/6

---

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව විනෝද බදු පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (vii) යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

**යෝජනාව**

26 වැනි අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ දෙවැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මුදල් අයකර ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට දර්ශන, සංගීත සංදර්ශන හෝ වෙනත් ඕනෑම විනෝද දර්ශනයක් වෙනුවෙන් එම දර්ශනය සඳහා නිකුත් කරන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 12%ක (සියයට දොලහක) විනෝද බද්දක් 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම යෝජනා කරමි.

12 - 276/7

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ගාස්තු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (viii) යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

**ඉහත කී යෝජනාව**

මහර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 1947/6 දරන 2015 දෙසැම්බර් මස 28 දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර පහත උපලේඛනයේ දැක්වෙන පරිදි ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මම තීරණය කරමි.

*උපලේඛනය*

| *ගාස්තුව* | *රු. ශත* |
|---|---|
| බල ප්‍රදේශය තුළ අයෙකුගේ | 5,000 0 |
| බල ප්‍රදේශයෙන් පිටත අයෙකුගේ | 10,000 0 |

12 - 276/8

---

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට අවමංගල සේවා සැපයුම් ස්ථාන සඳහා ගාස්තු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව අවමංගල සේවා සැපයුම් ස්ථාන සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (ix) යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

**යෝජනාව**

මහර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 1947/6 දරන 2015 දෙසැම්බර් මස 28 වැනි දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර පහත උපලේඛනයේ දැක්වෙන පරිදි මෙම ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි මම තීරණය කරමි.

*උපලේඛනය*

| *ගාස්තුව* | *රු. ශත* |
|---|---|
| අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |

12 - 276/9

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට ක්‍රීඩා භූමි පරිහරණය සඳහා ගාස්තු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව ක්‍රීඩා භූමි පරිහරණය සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (x) යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

**යෝජනාව**

මහර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට කරන ලද අංක 1947/6 දරන 2015 දෙසැම්බර් මස 28 වැනි දින *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර පහත උපලේඛන දැක්වෙන පරිදි මෙම ගාස්තු 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මම යෝජනා කරමි.

**ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට අයකරන ගාස්තු චක්‍රය :**

| *අංකය* | *ක්‍රීඩා භූමියේ නම* | *ගාස්තුව ක්‍රීඩාවක් සඳහා පෙ.ව. 7.00 සිට ප.ව. 4.00 දක්වා රු. ශත* | *වෙනත් කටයුත්තක් සඳහා රු. ශත* | *තැන්පත් මුදල රු. ශත* | *අතිරේක පැයක ගාස්තුව රු. ශත* | *විදුලි ආලෝක කිරීමේ ගාස්තු* | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | *අවම පැය 6ක් සඳහා රු. ශත* | *වැඩිවන සෑම පැයකට රු. ශත* |
| 01 | මල්වතුහිරිපිටිය ක්‍රීඩාංගනය | 2,000 0 | 2,000 0 | 5,000 0 | 500 0 | 12,000 0 | 2,000 0 |
| 02 | කැන්දලියද්දපාලුව වලව්වත්ත ක්‍රීඩාංගනය | 2,000 0 | 2,000 0 | 5,000 0 | 500 0 | - | - |
| 03 | ගොංගිතොට ගෝල්ඩන් ඇරෝස් ක්‍රීඩාංගනය | 1,000 0 | 1,000 0 | 5,000 0 | 500 0 | - | - |
| 04 | ගොංගිතොට රුවන්වලා ක්‍රීඩාංගනය | 2,000 0 | 2,000 0 | 5,000 0 | 500 0 | - | - |
| 05 | විළිඹුල මල්කැලේ | 1,000 0 | 1,000 0 | 5,000 0 | 500 0 | - | - |
| 06 | මාහරගම ක්‍රීඩාපිටිය | 1,000 0 | 1,000 0 | 5,000 0 | 500 0 | - | - |
| 07 | එච්. පී. ටී. වත්ත ක්‍රීඩාංගනය | 1,000 0 | 1,000 0 | 5,000 0 | 500 0 | - | - |

12 - 276/10

**මහර ප්‍රාදේශීය සභාව**

සැරසිලි විධිමත් කිරීම සඳහා ගාස්තු පැනවීම - 2026

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව සැරසිලි විධිමත් කිරීම සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (xii) යටතේ ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කරමි.

**යෝජනාව**

මහර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 1947/6 දරන 2015 දෙසැම්බර් මස 28 දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) සැරසිලි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර පහත උපලේඛනයෙන් දැක්වෙන පරිදි මෙම ගාස්තු 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි මම යෝජනා කරමි.

***උපලේඛනය***

***සැරසිල් විධිමත් කිරීමට අයකරන ගාස්තු චක්‍රය***

| *සැරසිලි කරන කාල සීමාව* | *ගාස්තුව* | *තැන්පත් මුදල* |
|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* |
| දිනකට | 500 0 | 5,000 0 |
| මසකට | 5,000 0 | 10,000 0 |

12 - 276/11

---

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට සේවා සඳහා ගාස්තු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව සේවා සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2025 නොවැම්බර් මස 11 දින යෝජනා අංක (ඊ) 4 (xii) යටතේ ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කරමි.

**යෝජනාව**

මහර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 1947/6 දරන 2015 දෙසැම්බර් මස 28 දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ සේවා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ දැක්වෙන පරිදි 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මම තීරණය කරමි.

*උපලේඛනය*

*අයදුම් පත්‍ර ගාස්තු :*

| | | රු. ශත |
|---|---|---|
| 1. | ඔප්පු සාරාංශ අයදුම්පත් | 100 0 |
| 2. | පුස්තකාල අයදුම්පත් | 50 0 |
| 3. | ගොඩනැගිලි අයදුම්පත් | 1,000 0 |
| 4. | බිම් කට්ටි අයදුම්පත් | 1,000 0 |
| 5. | වීථිරේඛා/නොපවරා ගැනීම/ගොඩනැගිලි සීමා/අයිතිය පිළිබඳ සහතිකයක් | 1,000 0 |
| 6. | අමතර වරිපනම් දැන්වීමක් | 100 0 |
| 7. | වරිපනම් උධෘත සඳහා එක් වර්ෂයකට | 100 0 |

*ගලි බවුසරයේ සේවා සැපයීමේ ගාස්තු :*

| | |
|---|---|
| බල ප්‍රදේශය තුළ (ලීටර් 4000) | 8,000 0 |
| බල ප්‍රදේශයෙන් පිටත (ලීටර් 4000) | 12,000 0 |
| බල ප්‍රදේශය තුළ (ලීටර් 8,000) | 15,000 0 |
| බල ප්‍රදේශයෙන් පිටත (ලීටර් 8,000) | 20,000 0 |

*රථ වාහන කුලියට දීමේ ගාස්තු :*

| | | |
|---|---|---|
| 1. | මෝටර් ග්‍රේඩරය මීටර් පැයකට (අවම පැය 4 ක් විය යුතුයි) | 6,000 0 |
| 2. | ලීටර් 3000 ජල බවුසරය සේවය සැපයීම | |
| 3. | ලීටර් 10000 ජල බවුසරය සේවය සැපයීම | |
| 4. | ලීටර් 10000 ජල බවුසරය සේවය සැපයීම | 20,000 0 |
| 5. | ට්‍රැක්ටර් 01ක් දිනකට (පැය 08 ක් සඳහා) | 12,000 0 |
| 6. | බැකෝ ලෝඩරය මීටර් පැයකට (අවම පැය 04 ක් විය යුතුය) | 4,600 0 |

*ජලනළ එලීම නිසා පළුදු වූ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වර්ග මීටරයට ගාස්තු :*

| | | |
|---|---|---|
| 1. | කුට්ටි ගල් මාර්ග (පාරිභෝගිකයින් විසින් ප්‍රතිසංස්කරණය කළ පසු) | 4,500 0 |
| 2. | කොන්ක්‍රීට් මාර්ග (පාරිභෝගිකයින් විසින් ප්‍රතිසංස්කරණය කළ පසු) | 3,500 0 |
| 3. | තාර යොදා ඇති මාර්ග | 7,500 0 |
| 4. | කාපට් මාර්ග | 10,000 0 |
| 5. | බොරළු මාර්ග | 1,500 0 |

12 - 276/12

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්ද පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 25 දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වගන්තිය සහ 148 වගන්තිය යටතේ විධිවිධාන ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම්,

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේ දී පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකුම එහි II තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30 සම්පූර්ණ වූ වහාම 2026 වර්ෂය සඳහා මෙම බද්ද ලුණුගල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කරමි."

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

**උපලේඛනය**

| | | *I තීරුව* | *II තීරුව* <br> *රු. ශත* |
|---|---|---|---|
| (1) | 01. | මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 100 00 |
| | 02. | සෑම බයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා : | |
| | | (අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 100 00 |
| | | (ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 00 |
| | 03. | පා පැදියක් සඳහා (තහඩුව සමග) <br> (තහඩු වියදම් සඳහා රු. 50 ක මුදලක් අය කරනු ලැබේ.) | 100 00 |

12-210/1

## ලුණුගල ප්‍රාදේශීය සභාව

### 2026 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 152(1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ බලපත්‍රයක් හෝ පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හෝ වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී කර ගෙන යනු ලබන සෑම තැනැත්තෙකු ගෙන්ම එකී ව්‍යාපාරයේ 2025 වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2026 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි."

**උපලේඛනය**

| | *I තීරුව*<br>*බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *II තීරුව*<br>*ගෙවිය යුතු බද්ද*<br>*රු . ශත* |
|---|---|---|
| 01. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| 02. | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| 03. | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 04. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| 05. | රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 06. | රු. 1,50,000 ඉක්මවන වන විට | 3,000 0 |

12-210/2

## ලුණුගල ප්‍රාදේශීය සභාව

### ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අදාළ සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2026 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය සහ 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

2012.05.18 දින හා අංක 1759 දරන ගැසට් පත්‍රය හා 2018.12.28 දින හා අංක 2104 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවලට අනුව ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය සහ 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත වාර්ෂික වටිනාකම පදනම්ව බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්, පවත්වාගෙන යන ව්‍යාපාර සඳහා 2026 මාර්තු 31 දිනට පෙර බලපත්‍ර ලබාගත යුතු බවත්,

එසේම, තවදුරටත් එවැනි යම් ස්ථානයක හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ ද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද අවස්ථාවක 2026 වර්ෂයට අයකරන බලපත්‍ර ගාස්තු 2025 වර්ෂයේ ඒ හෝටලයේ, ආපනශාලාවේ හෝ නවාතැන්පලේ ආදායමින් සියයට එකක් (1%) විය යුතු බවටත්, එම ගාස්තුව නියම කිරීම සඳහා හෝටලයේ, ආපනශාලාවේ හෝ නවාතැන්පලේ ගත වූ වර්ෂයේ සම්පූර්ණ ආදායම් විස්තරයක් අයිතිකරු, කළමනාකරු හෝ බලයලත් අයෙකු විසින් ලුණුගල ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු බවටත් මම තීරණය කරමි.''

**පළමු උපලේඛනය - පිඩාකාරී ව්‍යාපාර**

| | *I තීරුව* | *II තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 01. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | බත්, තේ සහ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | කොණ්ඩා සැකසීමේ සැලූන් හල් සහ බාබර් සාප්පු | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | මස් කඩ පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | කිරි පට්ටි හා කිරි වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |

| | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| අනු. අංකය | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 06. | උකස් ලියාපදිංචි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | අයිස් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | සිසිල් බීම කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ගව ගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පොදු වෙළඳසැළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | සංචාරක වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | පෞද්ගලික වෙළෙඳපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ලැගුම් නිවාස හා නවාතැන්පළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| | **ජනතා පීඩාකාරී ව්‍යාපාර** | | | |
| 1. | මිනිරන් සුද්ද කිරීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | සම් පදම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | සත්ත්ව පාලන (මස්, කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | සම් විකිණීමට තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කරවල, මාළු, ජාඩි කිලෝ 100 ට වඩා වැඩි ප්‍රමාණයක් තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | දුම්කොළ වේලීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සත්ත්ව ආහාර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පුන්නක්කු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සබන් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |

| | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| අනු. අංකය | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 19. | ට්‍රන්ක් පෙට්ටි සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ලෝහ සුන්බුන් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ගෘහ භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වේවැල් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | සිරප් හෝ පලතුරු බීම නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | රසකැවිලි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | පොල් ලෙලි නිපදවීම හෝ පල් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර) | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | දත් බුරුසු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | රා එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | විනාකිරි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | දැව ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | සෝඩා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | කෙඳි සායම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | සම් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | පලතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | කෝපි , ධාන්‍ය වර්ග පිටි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | බේකින් පවුඩර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | ගෑස් මැන්ටල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | කපුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | පොටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | ඉටිපන්දම් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | රෙදි සෝදන නිල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | ලාකඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | සුවඳ විලවුන් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | පාසල් රටහුණු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | ටයර් හෝ ටියුබ් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | ටයර් නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | සිමෙන්ති නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | වැලි කඩදාසි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

| | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| අනු. අංකය | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 55. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ගඩොල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | උළු නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදුකර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | කුකුළු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | විෂබීජනාශක නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | ටයර්/ටියුබ් අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | සපත්තු/බෑග්/සම්/භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| | **දෙවන උපලේඛණය**<br>**අන්තරාදායක ව්‍යාපාර** | | | |
| 1. | කළුගල් තැනීම හෝ කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | සිසිල් බීම නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | අයිස් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | එළවළු තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | පොල්තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | තේ පෙට්ටි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පිදුරු තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | හිරිගල් හෝ හුණු ගල් කැණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | හිස්ගෝනි හෝ හිස් බෝතල් එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

| | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| අනු. අංකය | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 18. | පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | විසිතුරු පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වැල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

**තුන්වැනි උපලේඛණය**
**පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර**

| | | | | |
|---|---|---|---|---|
| 1. | තලාතු මිනිරන් ශුද්ධ කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසල් හෝ කෙඳි වර්ග සකස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ඩ්‍රයික්ලීන් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | හුණුගල් හෝ හිරිගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | මෝර තෙල් සකස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | බෝට්ටු තැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ලෝහ වර්ග පෑස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | මෝටර් වාහන අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | මෝටර් වාහන සේවා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | වාත්තු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | මෝටර් වාහන බොඩි තැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | කෘමිනාශක, දිලීරනාශක, පැළෑටි හෝ පලිබෝධනාශක නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | විෂබීජ නාශක නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | මදුරු දඟර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | දැව ආරක්ෂණ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | ගල්තාර, හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

| | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| අනු. අංකය | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 24. | වීදුරු භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | වීදුරු කැඩපත් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | යකඩ තහඩු ගැල්වනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | පාස්සන ඊයම් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | කටු කම්බි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | කම්බි ඇණ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | කාබන් කඩදාසි හෝ යතුරුලියන පටි (රිබන්) නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබනික ටැංකි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ජී. අයි. බාල්දි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | යන්ත්‍රෝපකරණ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | විදුලි භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | සංචායක බැටරි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | ට්‍රැක්ටර් රථ එකලස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | රේඩියේටර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | වියළි කෝෂ බැටරි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | වී මෝල් | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | මිනී පෙට්ටි තැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | දුරකථන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | කරදිය මසුන් අළෙවි කිරීම (සංචාරක) | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | මිරිදිය මසුන් අළෙවි කිරීම (සංචාරක) | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | පක්ෂීන් ඇති කිරීම සහ මස් අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | ඌරු කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 150 (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2026 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් ලෙස මම තීරණය කරමි.”

**උපලේඛනය**

| *I තීරුව* | | *II තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01 | කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02 | මැටි බඳුන් නිපදවීම සහ අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 03 | පාවහන් සෑදීම සහ අළෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04 | වානේ ගෘහභාණ්ඩ සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 05 | ගඩොල් පෝරණු පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06 | ඉදල්, කොහු, පාපිසි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

12-210/4

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා හට ලැබී ඇති බලතල ප්‍රකාර, 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ඌව පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ සාදන ලද එකී 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ගැසට් පත්‍රය පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ යම්කිසි තැනැත්තෙකු විසින් යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ දී අවසර පත්‍රයක් සඳහා එකී අතුරු ව්‍යවස්ථා පනතේ (3) වන වගන්තියේ (උ) ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් 2026 වර්ෂයේ දී ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

**උපලේඛනය**

**ප්‍රචාරක දැන්වීම් විස්තරය**

වානේ වලින් නිමකළ ප්‍රචාරක දැන්විමක් සඳහා :

| | | *රු. ශත* |
|---|---|---|
| 1. | ප්‍රචාරක වෙළෙඳ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා කිසියම් ස්ථානයක සවිකිරීමේදී එක් වර්ග අඩියකට (ලිත් වර්ෂයකට) | 200 0 |
| 2. | යම් තැනැත්තෙකු විසින්, උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකර ඇති හෝ මහජනතාවට දැන ගැනීමට හැකි වන පරිදි යම් තැනකට සවිකර තබන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා වර්ග අඩියකට, | |
| | මසකට | 50 0 |
| | වර්ෂයකට | 75 0 |
| 3. | බිත්තියක හෝ තාප්පයක, පුවරුවක, ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට (සෑම වසරකම ගෙවිය යුතුය.) | 100 0 |
| 4. | විදුලි ආලෝක දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට (එක් පැත්තකට - ලිත් වර්ෂයකට) | 300 0 |
| 5. | විදුලි ආලෝක දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට (දෙපැත්ත සඳහා පැත්තකට - ලිත් වර්ෂයකට) | 600 0 |

12-210/5

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

දුරකතන කුළුණු/ඇන්ටනා කුළුණු ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු :

| | | |
|---|---|---|
| | | රු. ශත |
| උස මීටර් 05 සිට 20 දක්වා | - | 3,00,000 0 |
| උස මීටර් 20 සිට 40 දක්වා | - | 4,00,000 0 |
| උස මීටර් 40 සිට 50 දක්වා | - | 5,25,000 0 |
| වැඩිවන සෑම මීටර් 01ක් සඳහා ම | - | 15,000 0 බැගින් අයවිය යුතුය. |

දුරකතන කුළුණු/ඇන්ටනා කුළුණු ඉදිකිරීම හේතුවෙන් වැසෙන මුළු බිම් ප්‍රමාණය සඳහා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ පෙරසැරි ගාස්තුව රු. 2,812.50 ක මුදලක් අය කිරීමට මම තීරණය කරමි.

12-210/6

---

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාර, ලුණුගල ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මතම 2026 වර්ෂය සඳහා රුපියල් 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (iv) (ආ) කොටසේ 1989 පෙබරවාරි මස 03 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත ම 2026 වර්ෂය සඳහා රුපියල් 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු වශයෙන් ගෙවිය යුතු වේ.

(ඈ) 2026 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2026 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු වශයෙන් ගෙවීමට, විධාන කළ යුතු යැයි මම තීරණය කරමි.

12-210/7

---

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(1) වගන්තිය අනුව බදුල්ල දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය අනුව ලුණුගල ප්‍රාදේශීය සභාව ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද දියුණු කළ ප්‍රදේශය ඇතුළත ඇති සියලු නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම් හා ගෙපත්වල 2022 වර්ෂයේ පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබූ වාර්ෂික වටිනාකම් පිළිබඳ තක්සේරුව 146 (1) වගන්තියේ බලතල ප්‍රකාරව 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් 3.5% ක වරිපනම් බද්දක් ද 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම් බද්ද, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී බද්ද 2026 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනෙන් අවසන් වන කාර්තුවලට අදාළ වාරික වශයෙන් ගෙවිය යුතු බවට විධානය කිරීමටත්,

2026 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බද්ද 2026 ජනවාරි මස 31 වැනි දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10% ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවීමටත් මම තීරණය කරමි.

12-210/8

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ විධිවිධාන වලින් මා හට ලැබී ඇති බලතල ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේ දී පහත උපලේඛනයේ සඳහන් පරිදි සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද පනවා අය කිරීමටත්, එකී බද්ද 2026 මාර්තු මස 31 වැනි දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

**උපලේඛනය**

ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(*අ*) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(*ආ*) ඒ ඉඩම් ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමෙ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය දෙකට තුනට (2ට 3ට) වඩා අඩු වන්නේ නම්,

(*ඇ*) ඒ ඉඩම් විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති වන විටක, හෝ

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2025 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමෙ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට එකක (1%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2026 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

12-210/9

---

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් හා සතුන් අල්ලා ගැනීමේ ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 66 වන වගන්තිය ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සියලුම මාර්ගවල හෝ පොදු ස්ථාන හා ඒ අවට යම් කරත්තයක බැඳ ඇත්නම් මිස දිගේලි කර අයාලේ යමින් සිට හෝ සැරිසරන ගවයින්, මීගවයින්, එළුවන්, ආදී සතුන් ඇල්ලීමටත් එසේ අල්ලා ගනු ලබන සතුන් ගාල් කිරීමටත්, එසේ ගාල් කරනු ලබන සතුන් නිදහස් කිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2026 වර්ෂයේ අය කිරීමටත් සහ අයාලයේ යන සතුන් දින 10ක් තුළ අයිතිකරුවන් තම සතුන් නිදහස් කර නොගතහොත් එම කාලයට පසුව එකී සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා අදාළ ගාස්තු සහ වෙන්දේසි කිරීමේ වියදම් අය කිරීමටත් එසේ අය කරන මුදලින් තුනෙන් එකක් ඇල්ලීමට බලය පවරන ලද පුද්ගලයන්ට ගෙවීමටත් මම තීරණය කරමි.

**උපලේඛනය**

| | *රු. ශත* |
|---|---|
| ගවයින් හෝ මී ගවයින් ඇල්ලීමට (එක් සතෙකුට) | 2,500 0 |
| එළුවන් ඇල්ලීමට (එක් සතෙකුට) | 2,500 0 |
| ගවයින් ආරක්ෂා කිරීමේ ගාස්තු/එක් දිනකට එක් සතෙකුට | 3,000 0 |
| එළුවන් ආරක්ෂා කිරීමේ ගාස්තු/එක් දිනකට එක් සතෙකුට | 3,000 0 |
| ගවයින් නඩත්තු කිරීමේ ගාස්තු එක් දිනකට එක් සතෙකුට | 1,500 0 |
| එළුවන් නඩත්තු කිරීමේ ගාස්තු එක් දිනකට එක් සතෙකුට | 1,500 0 |

12-210/10

---

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා අයදුම්පත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

2026.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් පරිදි අයදුම්පත්‍ර හා වෙනත් ගාස්තු පනවා අය කිරීමට ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මම තීරණය කරමි.

**උපලේඛනය**

**අයදුම්පත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු - 2026 වර්ෂය**

| | *අයදුම්පත්‍ර ගාස්තු* | *රු. ශත* |
|---|---|---|
| 01. | වීථි රේඛා සහතික ගාස්තු | 2,500 0 |
| 02. | ජල අයදුම්පත් ගාස්තු | 300 0 |
| 03. | ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු | 500 0 |
| 04. | පුස්තකාල අයදුම්පත් ගාස්තු | 200 0 |
| 05. | කට්ටි සැලසුම් අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු | 100 0 |

| | *අයදුම්පත්‍ර ගාස්තු* | *රු. ශත* |
|---|---|---|
| 06. | වරිපනම් නම් ලේඛනයේ නම් වෙනස් කිරීමේ පෝරම ගාස්තු | 150 0 |
| 07. | වරිපනම් ලේඛනයේ සහතික නිකුත් කිරීමේ ගාස්තු | 300 0 |
| 08. | ගොඩනැගිලි පර්යේෂණයට යැවිය යුතු පෝරම ගාස්තු | 50 0 |
| 09. | පුස්තකාල සාමාජික ඇප තැන්පත් ගාස්තු | 100 0 |
| 10. | ප්‍රාදේශීය සභා පෙර පාසලකට ළමුන් ඇතුළත් කිරීමේ ගාස්තුව | 500 0 |
| 11. | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 1,000 0 |
| 12. | ක්‍රීඩා පිටිය ආදායම් උත්පාදනය නොවන උත්සව සඳහා දිනකට කුලියට දීම (ක්‍රීඩා) | 5,000 0 |
| 13. | ක්‍රීඩා පිටිය ආදායම් උපයන උත්සව සඳහා දිනකට කුලියට දීම (සැණකෙළි) | 5,000 0 |
| 14. | බස්නැවතුම්පල අසල දිනකට කුලියට දීම | 5,000 0 |
| 15. | බැකෝ ලෝඩරය ලබාදීම (පැයකට රියැදුරු සහිතව) ඉන්ධන රහිතව කුළියට දීම | |

රු. 4,000 0 + (පැයකට දැවෙන තෙල් ප්‍රමාණය L x වත්මන් ඩීසල් තෙල් 1 L ක මිල)

(පවතින වත්මන් ඩීසල් ලීටරයක මිල අනුව ඉහත ගාස්තුව ගණනය කරනු ලබන අතර ගමන් ආරම්භ කරන ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර අනුව සේවා ස්ථානයට යාමට සහ ඒමට එක් කිලෝමීටරයක් පාසා පවතින වත්මන් ඩීසල් ලීටරයක මිල ඉහත ගාස්තුවලට අමතරව එකතු වේ.)

12-210/11

---

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම මත ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 154 වගන්තියේ (I) වැනි උපවගන්තිය ප්‍රකාරව, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ලුණුගල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% කට (සියයට එකක්) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරුගේ නියෝජිතයා විසින් 2026 වර්ෂය සඳහා ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

12-210/12

## ලුණුගල ප්‍රාදේශීය සභාව

### 2026 වර්ෂය සඳහා ලුණුගල හා මඩොල්සිම බහුකාර්යය ගොඩනැගිලි වෙනුවෙන් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ඌව පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ සාදන ලද සම්මන්ත්‍රණ ශාලා අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2026 වර්ෂය සඳහා අය කිරීමට මම තීරණය කරමි.

**ලුණුගල බහුකාර්ය ගොඩනැගිල්ල**

**උපලේඛනය**

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | එක් දිනක් සඳහා ශාලාව කුළියට දීම<br>(පෙ.ව. 8.00 සිට - ප.ව. 5.00 දක්වා) | 32,500 0 |
| 02. | ඇප තැන්පත් මුදල (එක් දින, රාත්‍රි උත්සව, කෙටි රැස්වීම් සඳහා ද අදාළ වේ.) | 10,000 0 |
| 03. | පැය 4ට අඩු කෙටි රැස්වීමක් සඳහා පැයකට ගාස්තුව | 3,000 0 |
| 04. | රාත්‍රී උත්සව හා සාද සඳහා<br>(ප.ව. 5.00 සිට රාත්‍රී 12 දක්වා පමණි)<br>(ඉහත උත්සව සඳහා පුටු 100 හා මේස 20 ලබාදෙනු ඇත.) | 15,750 0 |
| 05. | බහු කාර්ය ගොඩනැගිල්ලේ පිටුපස ඇති මුළුතැන්ගේ ඉහළ මාලයේ ඇති කාමරයක් දිනකට කුලියට දීමේ ගාස්තුව රු. 2,000 0 වේ. | |
| 06. | රජයේ ආයතන විසින් පවත්වනු ලබන රැස්වීම් සම්මන්ත්‍රණ වැඩමුළු පුහුණු අවස්ථාවන් සඳහා පැයකට 750 0 | |

**මඩොල්සිම බහුකාර්ය ගොඩනැගිල්ල**

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 01. | එක් දිනක් සඳහා ශාලාව කුළියට දීම<br>(පෙ.ව. 8.00 සිට - ප.ව. 5.00 දක්වා) | 20,000 0 |
| 02. | ඇප තැන්පත් මුදල (එක් දින, රාත්‍රි උත්සව, කෙටි රැස්වීම් සඳහා ද අදාළ වේ.) | 10,000 0 |
| 03. | පැය 4ට අඩු කෙටි රැස්වීමක් සඳහා පැයකට ගාස්තුව | 1,500 0 |
| 04. | රාත්‍රී උත්සව හා සාද සඳහා<br>(ප.ව. 5.00 සිට රාත්‍රී 12 දක්වා පමණි)<br>(ඉහත උත්සව සඳහා පුටු 100 හා මේස 20 ලබාදෙනු ඇත.) | 10,000 0 |
| 05. | රජයේ ආයතන විසින් පවත්වනු ලබන රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු අවස්ථාවන් සඳහා පැයකට 500 0 | |

12-210/13

## ලුණුගල ප්‍රාදේශීය සභාව

### උත්සව භාණ්ඩ කුළියට දීම වෙනුවෙන් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උත්සව භාණ්ඩ කුයට දීම වෙනුවෙන් පහත සඳහන් ගාස්තු අය කිරීමට මම තීරණය කරමි.

| *අ. අ.* | *ද්‍රව්‍ය / භාණ්ඩය* | *දිනකට අය කරන මුදල රු. ශත* |
|---|---|---|
| 1 | බුෆේ භාජන කට්ටලය (භාජන 10ක් හැඳි 10ක් සමහ) | 2,000 0 |
| 2 | පිඟන් 1ක් | 15 0 |
| 3 | වතුර බොන වීදුරු 1ක් | 10 0 |
| 4 | බීම වීදුරු 1ක් | 10 0 |
| 5 | ගෑස් උදුන් (ලොකු) 01 ක් | 500 0 |
| 6 | සාස්පාන් 1ක් (30kg) | 500 0 |
| 7 | සාස්පාන් 1ක් (20kg) | 300 0 |
| 8 | සාස්පාන් 1ක් (10kg) | 200 0 |
| 9 | විශාල ප්‍රමාණයේ තාච්චි 1ක් | 500 0 |
| 10 | කුඩා ප්‍රමාණයේ තාච්චි 1ක් | 250 0 |
| 11 | තෙල් හැඳි (ලොකු) 1ක් | 30 0 |
| 12 | විදුලි හිරමණ 01ක් | 500 0 |
| 13 | 10kg රයිස් කුකර් 01ක් | 500 0 |
| 14 | Coffee Machine 01 ක් (ද්‍රව්‍ය රහිතව 20 ලීටර් හිස් බෝතලය සමග) | 1,500 0 |
| 15 | පීරිසි කෝප්ප 01ක් | 20 0 |
| 16 | Sound System | 6,000 0 |
| 17 | කිරිකප් එකක් | 10 0 |
| 18 | උණුසුම් සීතල ජල පෙරනය (ලීටර් 20 හිස් බෝතලය සමග) | 1,000 0 |
| 19 | එක් කුඩයක් සඳහා දිනකට | 250 0 |
| 20 | ප්ලාස්ටික් මේස 01ක් | 250 0 |
| 21 | කුඩයක් සහිත ප්ලාස්ටික් මේස 01ක් | 400 0 |
| 22 | ඇඳි රහිත ප්ලාස්ටික් පුටු 01ක් | 15 0 |
| 23 | ඇඳි සහිත කුෂන් පුටු එකක් | 30 0 |

| අ. අ. | ද්‍රව්‍ය / භාණ්ඩය | දිනකට අය කරන මුදල රු. ශත |
|---|---|---|
| 24 | GI බට 01ක් | 50 0 |
| 25 | තහඩු එකක් දිනකට කුලියට දීම | 20 0 |
| 26 | අඩි10 x 10 කැනපි හට් එකක් කුලියට ලබා දීම | 500 0 |
| 27 | ප්ලාස්ටික් පුටු එකක් කුලියට දීම | 15 0 |

ඉහත භාණ්ඩ වලින් කුලියට රැගෙන යන අවස්ථාවේ දී ආපසු ගෙවන ඇප තැන්පතුවක් ලෙස කුලියට ගන්නා භාණ්ඩ වලින් 50% ක ආරක්ෂක ඇප තැන්පතුවක් තිබිය යුතුයි.

**20 KV විදුලි ජනක යන්ත්‍රය (ඉන්ධන රහිතව)**

පළමු දිනයට රු. 10,000 ක මුදලකට ලුණුගල නගර සීමාව තුළ ඉන්ධන රහිතව (පළමු කි. මී. 02 ඇතුළත) කුලියට දෙනු ලබන අතර පළමු කි. මී. 02 න් පසු වැඩිවන සෑම කි. මී. 01 ක් සඳහාම රු. 250 බැගින් අයකරනු ලැබේ. මීට අමතරව රඳවා ගනු ලබන එක් දිනයකට රු. 6,000 බැගින් අමතර මුදලක් අය කරනු ලැබේ.

**අඩි 30 X 15 VIP හට් කුලියට දීම**

පළමු දිනයට රු. 10,000 ක මුදලකට කුලී පදනම මත ලබා දෙනු ලබන අතර අතිරේක සෑම දිනයක් සඳහාම රු. 5,000 ක මුදලක් අය කරනු ලැබේ. පළමු කි. මී. 02 තුළ ප්‍රවාහනය නොමිලේ සිදුකරන අතර වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු 250 බැගින් අය කරනු ලැබේ. එසේම අංග සම්පූර්ණ පැකේජයක් ලෙස ද මෙම හට් කුලියට ලබා ගත හැකිය. එහිදී මේස කවර සහිත මේස 10 ක් පුටු කවර සහිත පුටු 50ක්, භාජන කට්ටල 10ක බුෆේ සෙට් එකක් ද, ඇතුළත්ව දිනක කුලිය රු. 15,000 වේ.

**කුඩා සංදර්ශන වේදිකාව කුලියට දීම**

අඩි 15 X 15 සන්දර්ශන වේදිකාව පළමු දිනට රු. 20,000 ක කුළී පදනම මත ලබා දෙනු ලබන අතර අතිරේක සෑම දිනයක් සඳහාම රු. 5,000 බැගින් අය කරනු ලැබේ. මෙම සංදර්ශන වේදිකාව කුළී පදනම මත ලබා ගන්නා අය විසින් ප්‍රවාහන පහසුකම් සපයා ගත යුතු අතර වේදිකාව සවි කිරීම හා ගැලවීම සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ පුහුණුවලත් කණ්ඩායමක් මගින් සිදු කරනු ලබයි.

**බහුකාර්ය උත්සව ශාලාව තුළ ඇති ප්‍රොජෙක්ටරය කුළියට දීම**

පැයකට රු. 1,000 ක මුදලකට කුළියට ලබා දෙනු ලැබේ.

පැය හතරකට රු. 4,000 මුදලකට කුළියට ලබා දෙනු ලැබේ. (පැය 04ට වැඩි දවසක් සඳහා කුළී මුදල රු. 4,000 වේ.)

12-210/14

---

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා ඉඩම්, ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීමේ ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ ප්‍රාදේශීය සභාව සතු පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 1952 අංක 06 දරන ඌව පළාත් පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ ගොඩනැගිලි තැනීම සහ වැඩ කටයුතු අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනයේ දැක්වෙන අයුරින් ගාස්තු 2026 වර්ෂයට අයකළ යුතු බවට මම තීරණය කරමි.

**උපලේඛනය**

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | නේවාසික හා ආයතනික ගොඩනැගිලි සැලසුමක් අනුමත කිරීමේ ගාස්තු (වර්ග අඩියකට) | 2 0 |
| 02. | වාණිජ හා කර්මාන්ත ගොඩනැගිලි සැලසුමක් අනුමත කිරීමේ ගාස්තු (වර්ග අඩියකට) | 3 0 |
| 03. | අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම | 1,000 0 |
| 04. | මිනින්දෝරු සැලැස්ම අනුමැතිය | 1,000 0 |
| 05. | සංවර්ධන බලපත්‍රය නිකුත් කිරීම (සහතික පත්‍ර ගාස්තු) | |
| | 1. වාණිජ නොවන | 1,500 0 |
| | 2. වාණිජ | 2,000 0 |

12-210/15

---

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා නිවාස ඉදි කිරීම සඳහා භූමි ප්‍රමාණය නිශ්චය කිරීමේ ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ගම් ප්‍රදේශයට අයත් වන්නා වූ ඉඩම් තැනිතලා භූමියක ඉඩම් කට්ටිය අවම භූමි ප්‍රමාණය පර්චස් 6 විය යුතු අතර, දියුණු කළ ගම් ප්‍රදේශය පිටත ඉඩම්වල කට්ටියක අවම භූමි ප්‍රමාණය පර්චස් 10 විය යුතුය.

ඉඩමේ ආනතිය 45ට වැඩි භූමි සඳහා ඉඩම් කට්ටියක අවම භූමි ප්‍රමාණය පර්චස් 20 විය යුතු අතර, 45 අඩු ආනතිය ඇති භූමි සඳහා ඉඩම් කට්ටියක අවම භූමි ප්‍රමාණය පර්චස් 15 විය යුතුය.

ඉඩම් කට්ටියක්, සැලැස්මක් අනුමත කිරීමේ ගාස්තු :

| | |
|---|---|
| එක් කට්ටියක් සඳහා | රු. 1,000 0 |

12-210/16

## ලුණුගල ප්‍රාදේශීය සභාව

### 2026 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා මාර්ගවල ගමන් කරන වාහනවල බර හා සිදුවන හානි සම්බන්ධයෙන් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 70 වැනි වගන්තියේ (1), (2), (3) වගන්තිවලට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ එහි 07 වන කොටසේ මාර්ගවල ගමන් කරන වාහනවල බර සහ වේගය සීමා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2026 වර්ෂයට අය කළ යුතු බවට මම තීරණය කරමි.

**උපලේඛනය**

| අ. අ. | සංවර්ධනය සඳහා වියදම් කරන ලද මුදල (රුපියල්) | අය කළ යුතු ගාස්තුව |
|---|---|---|
| 1 | ලක්ෂ 01 සිට ලක්ෂ 03 දක්වා | අබලන් වූ කොටස් පමණක් පිළිසකර කිරීම සඳහා තක්සේරු කර අදාළ මුදල පනවා අය කිරීමට තීරණය කරමි. |
| 2 | ලක්ෂ 04 සිට ලක්ෂ 07 දක්වා | |
| 3 | ලක්ෂ 08 සිට ලක්ෂ 10 දක්වා | |
| 4 | ලක්ෂ 11 සිට ලක්ෂ 20 දක්වා | |

12-210/17

---

## ලුණුගල ප්‍රාදේශීය සභාව

### 2026 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

267 වැනි අධිකාරිය වන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැවැත්වෙන සෑම චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සැණකෙලි සංදර්ශනයක් සඳහා මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% විනෝද බද්දක් 2026 වර්ෂය සඳහා අය කිරීමටත් පහත සඳහන් පරිදි අවසර පත්‍ර ගාස්තුවක් ද අය කිරීමටත් මම තීරණය කරමි.

අවසර පත්‍ර ගාස්තුව රු. 1,000 0

12-210/18

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා ජල ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එම පනතේ 118 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ඌව පළාත් සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2026 වර්ෂයට අයකළ යුතු බවත්, එය සෑම මාසයක් සඳහා ම ගණනය කරනු ලබන ජල ගාස්තු ඊට පසු මාසයේ අවසන් දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

**උපලේඛනය**

ජල මනු සඳහා ගාස්තු පහත සඳහන් පරිදි වේ.

**ලුණුගල නාගරික ජල යෝජනා ක්‍රමය**

**ජල මනු ගාස්තු ලැයිස්තුව - 2026**

| *පරිභෝජනය* | *ගෘහස්ථ* | *ව්‍යාපාර* | *පාසල් හා ආගමික* | *රාජ්‍ය ආයතන* | *රජයේ රෝහල්* |
|---|---|---|---|---|---|
| 0 | 200.00 | 300.00 | 50.00 | 275.00 | 275.00 |
| 1 | 210.00 | 310.00 | 58.00 | 333.00 | 328.00 |
| 2 | 220.00 | 320.00 | 66.00 | 391.00 | 381.00 |
| 3 | 230.00 | 330.00 | 74.00 | 449.00 | 434.00 |
| 4 | 240.00 | 340.00 | 82.00 | 507.00 | 487.00 |
| 5 | 250.00 | 350.00 | 90.00 | 565.00 | 540.00 |
| 6 | 312.00 | 415.00 | 98.00 | 623.00 | 593.00 |
| 7 | 324.00 | 430.00 | 106.00 | 681.00 | 646.00 |
| 8 | 336.00 | 445.00 | 114.00 | 739.00 | 699.00 |
| 9 | 348.00 | 460.00 | 122.00 | 797.00 | 752.00 |
| 10 | 360.00 | 475.00 | 130.00 | 855.00 | 805.00 |
| 11 | 425.00 | 545.00 | 138.00 | 913.00 | 858.00 |
| 12 | 440.00 | 565.00 | 146.00 | 971.00 | 911.00 |
| 13 | 455.00 | 585.00 | 154.00 | 1029.00 | 964.00 |
| 14 | 470.00 | 605.00 | 162.00 | 1087.00 | 1017.00 |
| 15 | 485.00 | 625.00 | 170.00 | 1145.00 | 1070.00 |
| 16 | 555.00 | 750.00 | 178.00 | 1203.00 | 1123.00 |
| 17 | 575.00 | 775.00 | 186.00 | 1261.00 | 1176.00 |
| 18 | 595.00 | 800.00 | 194.00 | 1319.00 | 1229.00 |

| පරිභෝජනය | ගෘහස්ථ | ව්‍යාපාර | පාසල් හා ආගමික | රාජ්‍ය ආයතන | රජයේ රෝහල් |
|---|---|---|---|---|---|
| 19 | 615.00 | 825.00 | 202.00 | 1377.00 | 1282.00 |
| 20 | 635.00 | 850.00 | 210.00 | 1435.00 | 1335.00 |
| 21 | 710.00 | 980.00 | 218.00 | 1493.00 | 1388.00 |
| 22 | 735.00 | 1010.00 | 226.00 | 1551.00 | 1441.00 |
| 23 | 760.00 | 1040.00 | 234.00 | 1609.00 | 1494.00 |
| 24 | 785.00 | 1070.00 | 242.00 | 1667.00 | 1547.00 |
| 25 | 810.00 | 1100.00 | 250.00 | 1725.00 | 1600.00 |
| 26 | 890.00 | 1235.00 | 258.00 | 2058.00 | 1928.00 |
| 27 | 920.00 | 1270.00 | 266.00 | 2116.00 | 1981.00 |
| 28 | 950.00 | 1305.00 | 274.00 | 2174.00 | 2034.00 |
| 29 | 980.00 | 1340.00 | 282.00 | 2232.00 | 2087.00 |
| 30 | 1010.00 | 1375.00 | 290.00 | 2290.00 | 2140.00 |
| 31 | 1095.00 | 1515.00 | 298.00 | 2348.00 | 2193.00 |
| 32 | 1130.00 | 1555.00 | 306.00 | 2406.00 | 2246.00 |
| 33 | 1165.00 | 1595.00 | 314.00 | 2464.00 | 2299.00 |
| 34 | 1200.00 | 1635.00 | 322.00 | 2522.00 | 2352.00 |
| 35 | 1235.00 | 1675.00 | 330.00 | 2580.00 | 2405.00 |
| 36 | 1325.00 | 1820.00 | 338.00 | 2638.00 | 2458.00 |
| 37 | 1365.00 | 1865.00 | 346.00 | 2696.00 | 2511.00 |
| 38 | 1405.00 | 1910.00 | 3'54.00 | 2754.00 | 2564.00 |
| 39 | 1445.00 | 1955.00 | 362.00 | 2812.00 | 2617.00 |
| 40 | 1485.00 | 2000.00 | 370.00 | 2870.00 | 2670.00 |
| 41 | 1580.00 | 2150.00 | 378.00 | 2928.00 | 2723.00 |
| 42 | 1625.00 | 2200.00 | 386.00 | 2986.00 | 2776.00 |
| 43 | 1670.00 | 2250.00 | 394.00 | 3044.00 | 2829.00 |
| 44 | 1715.00 | 2300.00 | 402.00 | 3102.00 | 2882.00 |
| 45 | 1760.00 | 2350.00 | 410.00 | 3160.00 | 2935.00 |
| 46 | 1805.00 | 2510.00 | 418.00 | 3218.00 | 2988.00 |
| 47 | 1850.00 | 2570.00 | 426.00 | 3276.00 | 3041.00 |
| 48 | 1895.00 | 2630.00 | 434.00 | 3334.00 | 3094.00 |
| 49 | 1940.00 | 2690.00 | 442.00 | 3392.00 | 3147.00 |
| 50 | 1985.00 | 2750.00 | 450.00 | 3450.00 | 3200.00 |
| 51 | 2135.00 | 2820.00 | 458.00 | 4058.00 | 3803.00 |
| 52 | 2185.00 | 2890.00 | 466.00 | 4116.00 | 3856.00 |
| 53 | 2235.00 | 2960.00 | 474.00 | 4174.00 | 3909.00 |
| 54 | 2285.00 | 3030.00 | 482.00 | 4232.00 | 3962.00 |
| 55 | 2335.00 | 3100.00 | 490.00 | 4290.00 | 4015.00 |
| 56 | 2385.00 | 3170.00 | 498.00 | 4348.00 | 4068.00 |
| 57 | 2435.00 | 32401.00 | 506.00 | 4406.00 | 4121.00 |
| 58 | 2485.00 | 3310.00 | 514.00 | 4464.00 | 4174.00 |
| 59 | 2535.00 | 3380.00 | 522.00 | 4522.00 | 4227.00 |

| පරිභෝජනය | ගෘහස්ථ | ව්‍යාපාර | පාසල් හා ආගමික | රාජ්‍ය ආයතන | රජයේ රෝහල් |
|---|---|---|---|---|---|
| 60 | 2585.00 | 3450.00 | 530.00 | 4580.00 | 4280.00 |
| 61 | 2740.00 | 3540.00 | 538.00 | 4638.00 | 4333.00 |
| 62 | 2795.00 | 3630.00 | 546.00 | 4696.00 | 4386.00 |
| 63 | 2850.00 | 3720.00 | 554.00 | 4754.00 | 4439.00 |
| 64 | 2905.00 | 3810.00 | 562.00 | 4812.00 | 4492.00 |
| 65 | 2960.00 | 3900.00 | 570.00 | 4870.00 | 4545.00 |
| 66 | 3015.00 | 3990.00 | 578.00 | 4928.00 | 4598.00 |
| 67 | 3070.00 | 4080.00 | 586.00 | 4986.00 | 4651.00 |
| 68 | 3125.00 | 4170.00 | 594.00 | 5044.00 | 4704.00 |
| 69 | 3180.00 | 4260.00 | 602.00 | 5102.00 | 4757.00 |
| 70 | 3235.00 | 4350.00 | 610.00 | 5160.00 | 4810.00 |
| 71 | 3395.00 | 4460.00 | 618.00 | 5218.00 | 4863.00 |
| 72 | 3455.00 | 4570.00 | 626.00 | 5276.00 | 4916.00 |
| 73 | 3515.00 | 4680.00 | 634.00 | 5334.00 | 4969.00 |
| 74 | 3575.00 | 4790.00 | 642.00 | 5392.00 | 5022.00 |
| 75 | 3635.00 | 4900.00 | 650.00 | 5450.00 | 5075.00 |
| 76 | 3695.00 | 5010.00 | 658.00 | 5508.00 | 5128.00 |
| 77 | 3755.00 | 5120.00 | 666.00 | 5566.00 | 5181.00 |
| 78 | 3815.00 | 5230.00 | 674.00 | 5624.00 | 5234.00 |
| 79 | 3875.00 | 5340.00 | 682.00 | 5682.00 | 5287.00 |
| 80 | 3935.00 | 5450.00 | 690.00 | 5740.00 | 5340.00 |
| 81 | 4100.00 | 5580.00 | 698.00 | 5798.00 | 5393.00 |
| 82 | 4165.00 | 5710.00 | 706.00 | 5856.00 | 5446.00 |
| 83 | 4230.00 | 5840.00 | 714.00 | 5914.00 | 5499.00 |
| 84 | 4295.00 | 5970.00 | 722.00 | 5972.00 | 5552.00 |
| 85 | 4360.00 | 6100.00 | 730.00 | 6030.00 | 5605.00 |
| 86 | 4425.00 | 6230.00 | 738.00 | 6088.00 | 5658.00 |
| 87 | 4490.00 | 6360.00 | 746.00 | 6146.00 | 5711.00 |
| 88 | 4555.00 | 6490.00 | 754.00 | 6204.00 | 5764.00 |
| 89 | 4620.00 | 6620.00 | 762.00 | 6262.00 | 5817.00 |
| 90 | 4685.00 | 6750.00 | 770.00 | 6320.00 | 5870.00 |
| 91 | 4855.00 | 6900.00 | 778.00 | 6378.00 | 5923.00 |
| 92 | 4925.00 | 7050.00 | 786.00 | 6436.00 | 5976.00 |
| 93 | 4995.00 | 7200.00 | 794.00 | 6494.00 | 6029.00 |
| 94 | 5065.00 | 7350.00 | 802.00 | 6552.00 | 6082.00 |
| 95 | 5135.00 | 7500.00 | 810.00 | 6610.00 | 6135.00 |
| 96 | 5205.00 | 7650.00 | 818.00 | 6668.00 | 6188.00 |
| 97 | 5275.00 | 7800.00 | 826.00 | 6726.00 | 6241.00 |
| 98 | 5345.00 | 7950.00 | 834.00 | 6784.00 | 6294.00 |
| 99 | 5415.00 | 8100.00 | 842.00 | 6842.00 | 6347.00 |
| 100 | 5485.00 | 8250.00 | 850.00 | 6900.00 | 6400.00 |

(ඒකක එකක් යනු ජල ලීටර් 1,000)

මනුවට පිටතින් ජලය ලබා ගැනීම හෝ ජල මනුව අක්‍රිය කිරීම හෝ ජල මනුව ඉවත් කළහොත් හෝ එවැනි අයථා ක්‍රියාවන් සඳහා දඩ මුදල රු. 15,000 කි.

විසන්ධි කරන ලද ජල සම්බන්ධතා නැවත සන්ධි කිරීමේ ගාස්තුව රු. 3,000 0 කි.

නව ජල සම්බන්ධතා ලබා ගැනීමේ ඇස්තමේන්තු මුදල රු. 20,000 0 කි.

(අඩි 50 සීමාව දක්වා පමණි. ඉන් ඉදිරියට ඇස්තමේන්තු කරන මුදල ගෙවිය යුතු වේ. මාර්ග පළුදු කිරීමට සිදුවන අවස්ථාවේ දී අදාළ ආයතන විසින් ඇස්තමේන්තු කරන මුදල අදාළ ආයතනවලට ගෙවිය යුතු වේ.)

ජල සම්බන්ධතා ලබාගැනීමේ තැන්පත් මුදල රු. 2,000 0 කි

ජල නාම ලේඛනයේ නම සංශෝධනය කිරීමේ ගාස්තුව රු. 1,000 0 කි.

ජල මීටර් කණු වෙනස් කිරීමේ මුදල රු. 2,000 0 කි

ජලය සහිත ජල බවුසරය කුළියට දීමේ ගාස්තුව (පළමු කි. මී. 2 ඇතුළත) රු. 3,000 0 කි

(නගරය ඇතුළත යනු ප්‍රාදේශීය සභා භූමියේ සිට පළමු කි. මී. 2 ඇතුළතයි. ප්‍රාදේශීය සභා භූමියේ සිට පළමු කි. මී. 2 ඉක්ම වූ විට සෑම කි. මී. 1ක් සඳහා ම රු. 200 0 බැගින් අය කරනු ලබයි.)

යපම්ම ජල යෝජනා ක්‍රමයේ ජල ගාස්තුව රු. 200 0 කි.
වේල්ලවල ජල යෝජනා ක්‍රමයේ ජල ගාස්තුව රු. 200 0 කි.
මඩොල්සිම ජල යෝජනා ක්‍රමයේ ජල ගාස්තුව රු. 200 0 කි.
ජල සාම්පල් පරීක්ෂා කිරීමේ ගාස්තුව රු. 600 0 කි.

12-210/19

---

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා කඩ කාමර පැවරුම් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභාපති නුවන් සපුමල් ඕපාත වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ලුණුගල ප්‍රාදේශීය සභාවට අයත් ලුණුගල නගරයේ හා මඩොල්සිම නගරයේ පිහිටි කඩ කාමර ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව උරුමකරුවන්ට පැවරිය හැකි අතර, ඒ සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට මම තීරණය කරමි.

1. ලුණුගල නගරයේ එක් කඩ කාමරයක පැවරුම් ගාස්තුව රු. 25,000 0
2. මඩොල්සිම නගරයේ එක් කඩ කාමරයක පැවරුම් ගාස්තු රු. 25,000 0

12-210/20

**ලුණුගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05/1/1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නුවන් සපුමල් ඕපාත,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනතේ අංක 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය මගින් පවරා ඇති බලතල ප්‍රකාර ව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් අංක 2264/18 සහ 2022.01.27 දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදනයෙන් හා 2008.02.01 දිනැති අංක 1534/18 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ හා තත්ත්ව) නියෝග සමඟ එහි 2022.01.27 දිනැති අංක 2264/17 දරන ගැසට් නිවේදනයෙන් පනවන ලද රෙගුලාසිවලට අනුකූලව එකී ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් අදාළ වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉදිරියට උපරිම වර්ෂ තුනකට රු. 4,500 ක බලපත්‍ර ගාස්තුවක් මෙම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාකාරකම් :

01. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්ත ව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
02. සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින බතික් කර්මාන්ත
03. සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
04. රෙදි වියන යන්ත්‍ර මැෂින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
05. දිනකට ලීටර් 200 ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
06. පොල් තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
07. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත
08. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්
09. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත

13. සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්ත ව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250 ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 ක් හෝ ඊට වැඩි සහ 50 ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතයු පක්ෂීන් සංඛ්‍යාව + 50 (ඌරන් සංඛ්‍යාවූ ගවයින් සංඛ්‍යාව) + 10 (එළුවන් සංඛ්‍යාව)
20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්රික් ටොන් 20 ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5 කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස් අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිත ව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු
30. දිනකට ඝන මීටර් 25 ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 සහ ඊට වැඩි සහ 10 කට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25 ක් හෝ ඊට වැඩි සහ 100 ට අඩු පුද්ගලයින් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැඟුම්හල්
35. විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ්
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා
39. මෙම උපලේඛනයේ ඇ කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සහ 50 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්.

12-210/21

**මහව ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් 16 දින පවත්වන ලද මහව ප්‍රාදේශීය සභා රැස්වීමේ දී යෝජනා අංක 07/2025/05/05/04-01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ඇති බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. එම්. පී. ආර්. සුමේධ කුමාර හේරත්,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 16 දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උපවගන්තිය යටතේ මහව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ වරිපනම් කාලපය ඇතුළත පිහිටි නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂයේ ක්‍රියාත්මකවූ 2025 වර්ෂයේ (පෙර වර්ෂයේ) දී ද පිළිගෙන ක්‍රියාත්මක කරන ලද තක්සේරුව 2026 වර්ෂය සඳහා තක්සේරුවක් ලෙස පිළිගත යුතු බවටත්,

එකී පනතේ 134 (1) උපවගන්තිය යටතේ එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට 4 (4%) ක වාර්ෂික වටිනාකම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2026 වර්ෂයෙ හි, පහත උපලේඛනයෙ හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද මහව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2026 ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම්, වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වටිනාකමක් ද, එකී උපලේඛනයෙ හි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල මහව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම්, එක් කාර්තුවකට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද මහව ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවටත් යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *I තීරුව*<br>*කාර්තුව* | *II තීරුව*<br>*ගෙවිය යුතු දිනය* | *III තීරුව*<br>*5% වට්ටම සඳහා හිමිකම ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2026.03.31 දිනට පෙර | 2026.01.31 |
| දෙවන කාර්තුව | 2026.06.30 දිනට පෙර | 2026.04.30 |
| තුන්වන කාර්තුව | 2026.09.30 දිනට පෙර | 2026.07.31 |
| හතරවන කාර්තුව | 2026.12.31 දිනට පෙර | 2026.10.31 |

12-217/1

**මහව ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් 16 දින පවත්වන ලද මහව ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 07/2025/05/05/04-02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ඇති බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. එම්. පී. ආර්. සුමේධ කුමාර හේරත්,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 16 දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**2026 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීමේ යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙ හි I තීරුවෙහි සඳහන් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයෙහි II තීරුවෙහි එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයෙහි වාර්ෂික වටිනාකමට අනුව අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක්, 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙක් එකී කර්මාන්ත බද්ද 2026 වර්ෂයට අදාළව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවට යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *I තීරුව* | *II තීරුව* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත* |
| 1. | විසිතුරු හා කැටයම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | ඔරලෝසු අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | විදුලි උපකරණ හා විද්‍යුත් උපකරණ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | අත් යන්ත්‍ර රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | වී මෝලක් /ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | සිසිල් බීම නිෂ්පාදනය කිරීම (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි නිර්දේශය අවශ්‍ය වේ.) | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීම | 500 0 | 700 0 | 1,000 0 |
| 8. | විදුලි බල්බ් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | හඳුන්කූරු නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | වැහිපීලි හෝ දම්වැල් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1.000 0 |
| 11. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ඉදල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

## මහව ප්‍රාදේශීය සභාව

### 2026 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගාස්තු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් 16 දින පවත්වන ලද මහව ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 07/2025/05/05/04-3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ඇති බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. එම්. පී. ආර්. සුමේධ කුමාර හේරත්,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 16 දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් මහව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව එකී පනත යටතේ සාදනු ලබන අතුරු ව්‍යවස්ථාවක සඳහන් කර ඇති පහත I තීරුවෙහි සඳහන් එක් එක් කර්මාන්තය සඳහා මහව ප්‍රාදේශීය හා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා පිළිගෙන ඇති හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පොළක් වන විට, එකී හෝටලයේ හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පලෙහි පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් (1) එකක ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් අදාළ බලපත්‍ර ගාස්තුව මහව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවන ලෙස සභාවේ ලේකම්වරයා විසින් නිවේදනය කරන දින සිට දින 07ක් ඇතුළත ගෙවිය යුතු බවටත් මහව ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *I තීරුව* | *II තීරුව* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්භාභවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත* |
| | **අප්‍රසන්න ව්‍යාපාර :** | | | |
| 1. | මිනිරන් සුද්ද කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට ළඟ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | සම් පදම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | සම් විකිණීමට ළඟ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා ) | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | උම්බලකඩ නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්භාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි<br>රු. ශත |
| 10. | කරවල, ලුණු, මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම | 500 0 | 700 0 | 1,000 0 |
| 11. | මාළු හෝ මස් ජාඩි දැමීම, වේලීම හෝ අයිස් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | දුම්කොළ වියලීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සත්ත්ව ආහාර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පුන්නක්කු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සබන් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ට්‍රන්ක් පෙට්ටි සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ලෝහ සුන්බුන් තබා ගැනීම | 500 0 | 700 0 | 1,000 0 |
| 22. | ගෘහ භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වේවැල් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | සිරප් හෝ පළතුරු බීම නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | රස කැවිලි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | පොල් ලෙලි පෙඟවීම හෝ පල් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර) | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | දත් බුරුසු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | රා එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | විනාකිරි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | දැව ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | පින්තාරු වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | සෝඩා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | කෙඳි සායම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | සම් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | බේකින් පවුඩර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | ගෑස් මැන්ටල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | පොටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ඉටිපන්දම් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | කපුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්භාභවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි<br>රු. ශත |
| 45. | රෙදි සෝදන නිල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | ලාකඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | සුවඳ විලවුන් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | පාසල් රට හුණු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | ටයර් හෝ ටියුබ් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | ටයර් නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | ටයර්, ටියුබ් වොල්කනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | සිමෙන්ති නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | සිමෙන්ති භාණ්ඩ, ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | වැලි කඩදාසි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ගඩොල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | අම්ල නිෂ්පාදනය කිරීම හා නැවත ඇඹිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | උළු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි | 500 0 | 750 0 | 1,000 0 |
| | පිරිසිදු කර විකිණීම | | | |
| 61. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

**අන්තරාදායක ව්‍යාපාර**

| | | | | |
|---|---|---|---|---|
| 1. | කළුගල් කැනීම හෝ කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | එළවළු තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | පොල් තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | තේ පෙට්ටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | පිදුරු තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කර අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | හිරිගල් හෝ හුණුගල් කැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්භාභවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත |
| 16. | පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | විසිරි පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ නිපදවීම) | 500 0 | 750 0 | 1,000 0 |
| | | | | |
| 1. | ලැගුම් නිවාස සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | හෝටල් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බේකරි සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | කිරි පට්ටි හා කිරි වෙළෙඳාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | බත් කඩ, ආපනශාලා හා තේ කඩ හෝ කෝපි වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | ආහාර පිසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | අයිස් කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | සිසිල් බීම කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ලොන්ඩරි | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | සංචාරක වෙළෙන්දෝ | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ගව ගාල් | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සාතක මඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හා බාබර් සාප්පු | 500 0 | 750 0 | 1,000 0 |

12-217/3

---

**මහව ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් 16 දින පවත්වන ලද මහව ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 07/2025/05/05/04-4 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ඇති බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ජේ. එම්. පී. ආර්. සුමේධ කුමාර හේරත්,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 16 දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) උප වගන්තියෙන් යටතේ මහව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද එම අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් කර්මාන්තයක් මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ආදායම් ලැබීම් මෙහි උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *2025 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *ගෙවිය යුතු බද්ද රු. ශත* |
|---|---|---|
| 1 | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2 | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 0 නොඉක්මවන විට | 90 0 |
| 3 | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 0 නොඉක්මවන විට | 180 0 |
| 4 | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 0 නොඉක්මවන විට | 360 0 |
| 5 | රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 0 නොඉක්මවන විට | 1,200 0 |
| 6 | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

12-217/4

---

**මහව ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් 16 දින පවත්වන ලද මහව ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 07/2025/05/05/04-5 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ඇති බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. එම්. පී. ආර්. සුමේධ කුමාර හේරත්,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 16 දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තිය යටතේ මහව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව යතෝක්ත අක්කර බද්ද 2026 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් මස 31 දිනවලත් අවසන් කාර්තු 4 තුළදී සමාන වාරික 4කින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන්තියේ (6) උප වගන්තියේ බලතල ප්‍රකාරව, එසේ නියම කරන ලද අක්කර බද්ද 2026 ජනවාරි මස 31 දිනට පෙර ප්‍රදේශීය සභා කර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක්ද එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත්සියට පහක (5) වට්ටමක්ද දෙනු ලබන බවට මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

(අ) ඉහත කී පනතේ 134 වගන්තියේ (3) උපවගන්තියෙන් අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ 1989.03.10 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2026 වර්ෂය සඳහා රු. 50 (පනහක්) බැගින් වාර්ෂික බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) හෙක්ටයාර් 05 හෝ ඊට වැඩිවන සෑම අවස්ථාවකම ඒ වෙනුවෙන්, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2026 වර්ෂය සඳහා රුපියල් 10 (දහය) බැගින්වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) උපවගන්තියේ විධිවිධාන යටතේ 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද තීරණය කරමි.

2026 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2026 ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට (10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට (5%) ක වට්ටමක් ද දෙනු ලබන බවට නිවේදනය කරමි.

12-217/5

---

**මහව ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් 16 දින පවත්වන ලද මහව ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 07/2025/05/05/04-6 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ඇති බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. එම්. පී. ආර්. සුමේධ කුමාර හේරත්,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 16 දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය හා (4) උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේ දී පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම එහි II තීරුවේ අනුරූපිත සටහනෙ හි නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එකී වාහන හා සත්ව බද්දට යටත් තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2026 වර්ෂය සඳහා මෙම බද්ද මහව ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *I තීරුව* | *II තීරුව* |
|---|---|---|
| | බද්ද අදාළවන වර්ෂයට හෝ වර්ෂය වනතෙක් ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද රු. ශත |
| I | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| II | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකලයක්, කරත්තයක්, හෝ බයිසිකල් කරත්තයක් සඳහා - | |
| | (අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | (ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| III | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| IV | සෑම අත්කරත්තයක් සඳහා | 10 0 |
| V | සෑම රික්ෂෝවක් සඳහා | 7 00 |
| VI | සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| VII | සෑම ඇතකු සඳහා | 50 0 |

02. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

03. ඉහත සඳහන් වෙළෙඳ කාර්යය යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-217/6

---

**මහව ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් 16 දින පවත්වන ලද මහව ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා අංක 07/2025/05/05/04-7 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ඇති බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. එම්. පී. ආර්. සුමේධ කුමාර හේරත්,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 16 දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවකින් හෝ වෙන යම් නීතියකින් පැනවී ඇති බලතල අනුව මෙහි පහත සඳහන් එක් එක් කාර්යය සඳහා එය ඉදිරියෙන් දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් 2026 වර්ෂයේදී පනවා අයකිරීමට ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

| | | රු. ශත |
|---|---|---|
| 01. | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 1,200 0 |
| 02. | කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම | 2,000 0 |

පුස්තකාල සාමාජිකත්වය ලබාගැනීම

| | *සාමාජික ගාස්තුව රු. ශත* | *සාමාජිකත්වය අලුත් කිරීම රු. ශත* |
|---|---|---|
| වැඩිහිටියන් සඳහා | 60 0 | 45 0 |
| ළමුන් සඳහා | 40 0 | 30 0 |

| | | රු. ශත |
|---|---|---|
| 04. | ජල සැපයුම් අයදුම්පත්‍ර නිකුත් කිරීම | 2,500 0 |
| 05. | පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තු | 50 0 |
| 06. | වරිපනම් තක්සේරු ලේඛනයේ නම වෙනස් කිරීම | 1,000 0 |
| 07. | ප්‍රසිද්ධ රඟුම් බලපත්‍ර - සංදර්ශන සඳහා දිනකට | 1,000 0 |

ක්‍රීඩා පිටි කුලියට දීම -

එක් දිනකට

I. දිගන ක්‍රීඩා පිටිය සඳහා :

| *අනු. අංකය* | *ක්‍රීඩා පිටිය* | *කාරණය* | *මුදල රු.* | *තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 01 | දිගන ක්‍රීඩා පිටිය | මුදල් අයකර පවත්වනු ලබන ක්‍රීඩා උත්සවයක් හෝ වෙනත් විනෝද කටයුත්තක් - පැය 12 සඳහා | 25,000 0 | 10,000 0 |
| | | වෙනත් කාර්යන් සඳහා - පැය 12 සඳහා | 8,000 0 | |
| | | වෙනත් කාර්යන් සඳහා - පැය 24 සඳහා | 15,000 0 | |
| | | වෙනත් කාර්යන් සඳහා - පැය 06 සඳහා | 5,000 0 | |
| | | වැඩි වන පැයක් සඳහා - (වැයවන විදුලි ගාස්තු අයකරනු ලැබේ.) | 3,000 0 | |
| 02 | දළදාගම ක්‍රීඩා පිටිය | සංගීත සංදර්ශනයක් හෝ ක්‍රීඩා උත්සවයක් හෝ වෙනත් විනෝද කටයුත්තක් | 25,000 0 | 10,000 0 |
| | | වෙනත් කාර්යන් සඳහා - පැය 12 සඳහා | 8,000 0 | |
| | | වෙනත් කාර්යන් සඳහා - පැය 24 සඳහා | 15,000 0 | |
| | | මුදල් අයකර පවත්වනු ලබන ක්‍රීඩා උත්සව සඳහා | 10,000 0 | |
| | | වැඩිවන පැයක් සඳහා | 2,000 0 | |
| | | පැය 6 ක් සඳහා (වරුවකට) | 5,000 0 | |

| අනු. අංකය | ක්‍රීඩා පිටිය | කාරණය | මුදල රු. | තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|
| 03 | මහව ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය/ නාගොල්ලාගම/ අඹන්පොළ | සංගීත සංදර්ශනයක් හෝ ක්‍රීඩා උත්සවයක් සඳහා - පැය 12 සඳහා | 15,000 0 | |
| | | පැය 24 සඳහා | 25,000 0 | |
| | | වැඩිවන පැයක් සඳහා | 2,000 0 | |
| | | පැය 6ක් සඳහා (වරුවකට) | 5,000 0 | |
| | | වෙනත් කාර්යන් සඳහා - පැය 12සඳහා | 5,000 0 | |
| | | වෙනත් කාර්යන් සඳහා - පැය 24 සඳහා | 8,000 0 | 20,000 0 |
| 04 | මහව සතිපොළ වෙළඳ භූමිය සඳහා පැය 12 සඳහා | 25,000 0 | | |
| | මහව සතිපොළ වෙළඳ භූමිය සඳහා පැය 24 සඳහා | 35,000 0 | | |

08. තාවකාලික වෙළෙඳ කුටි සඳහා දිනකට — රු. 1,000 0
09. පරිසර බලපත්‍ර සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තු — රු. 100 0
10. පරිසර බලපත්‍ර සඳහා අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු — රු. 100 0
11. සහතික පිටපත් නිකුත් කිරීම හා ඉල්ලීම් මත ලිපි නිකුත් කිරීම සඳහා එක් පිටපතකට හෝ එක් ලිපියකට — රු. 100 0
12. අලෙවි ප්‍රවර්ධන කාර්යයන් සඳහා ගාස්තු අය කිරීම - දිනකට (අලෙවි ප්‍රවර්ධන කාර්යේ ස්වභාවය සහ භාවිතා කරන ඉඩ ප්‍රමාණය අනුව) — රු. 3,000 0 සිට රු. 10,000 දක්වා
13. ජල සැපයුම් ප්‍රතිසංධිත ගාස්තු — රු. 3,000 0

14. **ජල බවුසරය මගින් ජලය ලබාදීමේ දී අයකරනු ලබන ගාස්තු :**

| බවුසරයේ ප්‍රමාණය | දිනකට අයකරන මුදල | වැඩිවන කි. මී. ගණනට අයකිරීම |
|---|---|---|
| ලීටර් 6,000 ලොරි බවුසරය - දිනකට | රු. 23,000.00 (දිනකට උපරිම කි. මී. 100ට යටත්ව හා කි.මී. 100 ට වැඩි) | කි. මී. 100ට වැඩිවන සෑම කි.මී. 1 ක් සඳහා ම රු. 230.00 |
| ලොරි ජල බවුසරයක් - ලීටර් 6,000 එක් බවුසරයක් සඳහා (ජලය ඉවත් කර ගැනීම සඳහාවන අතර, රථය නවතා තබනු නොලැබේ. | රු. 3,500.00 | සෑම කි. මී. 1ක් සඳහා ම වාහනයේ මීටරය අනුව (ප්‍රාදේශීය සභාවෙන් පිටත් වන අවස්ථාවේ සිට ප්‍රාදේශීය සභාවට පැමිණෙන තෙක් යාම සහ ඒම සඳහා) - 231.00 |

15. **ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍ර කුලියට දීමේ දී අයකරනු ලබන ගාස්තු :**

| යන්ත්‍රය | ගෙවිය යුතු මුදල - රු. ශත | දිනකට අනිවාර්ය පැය ගණන / කි.මී. ගණන |
|---|---|---|
| මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය | එක් මීටර් පැයක් සඳහා 7,500.00 | 4 |
| බැකෝලෝඩර් යන්ත්‍රය | එක් මීටර් පැයක් සඳහා 6,130.00 | 4 |
| ටොන් 8 ගල් රෝල | එක් මීටර් පැයක් සඳහා 6,000.00 | 4 |
| කියුබ් 2.5 ටිපර් රථය එක් අවස්ථාවකට ප්‍රවාහනය සඳහා | ස්ථාවර ගාස්තුව - 2,500.00 වැඩිවන සෑම කි.මීටරයක් සඳහාම - රු. 230.00 | |

| *යන්ත්‍රය* | *ගෙවිය යුතු මුදල - රු. ශත* | *දිනකට අනිවාර්ය පැය ගණන / කි.මී. ගණන* |
|---|---|---|
| කියුබ් 2.5 ටිපර් රථය (උපරිම කි.මී. 100 යටත්ව) කි.මී. 100ට වැඩිවන සෑම කි.මීටරයක් සඳහාම රු.230.00ක් අය කෙරේ | දිනකට - රු. 23,000.00 | 4 |
| ට්‍රැක්ටර් බවුසරය - ලීටර් 4,000 සහ තණකොල කපන යන්ත්‍ර සහිත ට්‍රැක්ටරය (උපරිම මීටර් පැය 8ට යටත්ව) | දිනකට රු. 18,100.00 | 8 |
| ට්‍රැක්ටර් බවුසර් 1ක් සඳහා ලීටර් 4,000<br>(උපරිම පැය 2ට යටත්ව වන අතර වැඩිවන මීටර් පැයක් සඳහා | රු. 4,500.00<br>රු. 2,250.00 | උපරිම පැය 4 |

(මෙය ප්‍රදේශ වාසීන්ගේ පානීය ජල අවශ්‍යතාවය මූලික කර ගත් මුදල් තත්ත්වයක්වන අතර, මෙයින් පානීය ජලය පමණක් සපයනු ලැබේ.)

ඉහත ඉදිරිපත් කළ සියලු වාහන සඳහා වන මිළ ගණන් වෙනස් වීම හා වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියේ වාහන හා යන්ත්‍රෝපකරණ මිල ගණන් වෙනස්වීම මත සංශෝධනය විය හැකිය.

| | | |
|---|---|---|
| | | රු. ශත |
| 16. | වීථි රේඛා සහතික නිකුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 200 0 |
| 17. | පිඹුරු අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 200 0 |
| 18. | ගොඩනැගිලි අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 500 0 |

19. ගොඩනැගිලි ඉදිකිරීම/ පවත්නා ගොඩනැගිලිවලට අලුතින් කොටසක් එකතු කිරීම/ නැවත ඉදිකිරීම (නාගරික නොවන බල ප්‍රදේශ) අයකළ යුතු පෙරසැරි ගාස්තුව

| *ගෙබිමේ විශාලත්වය වර්ග මීටර්වලින්* | *පදිංචිය සඳහා<br>රු.* | *වානිජ හෝ වෙනත්<br>රු.* |
|---|---|---|
| 45 ට අඩු | 500 0 | 1,000 0 |
| 45 - 90 | 2,500 0 | 1,500 0 |
| 91 - 180 | 3,500 0 | 2,500 0 |
| 181 - 270 | 4,500 0 | 3,500 0 |
| 271 - 450 | 5,500 0 | 5,500 0 |
| 451 - 675 | 6,500 0 | 7,500 0 |
| 676 - 900 | 7,500 0 | 9,500 0 |
| 901 - 1,225 | 8,500 0 | 11,500 0 |
| 1,225 ඉක්මවන විට සෑම වර්ග මීටර් 90 ක් සඳහා අත්තිකාරම් මුදලක් ගෙවීම | 1,000 0 බැගින් | 1,000 0 බැගින් |

20. මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම සඳහා අය කළයුතු ගාස්තු (නාගරික නොවන බල ප්‍රදේශ)

| *විස්තරය* | *නේවාසික දික් මීටර් 1 ක් සඳහා රු. ශත* | *වානිජ හා වෙනත් දික් මීටර් 1 ක් සඳහා රු. ශත* |
|---|---|---|
| ගොඩනැගිලි සීමාවෙන් පිටත | 300 0 | 400 0 |
| ගොඩනැගිලි සීමාව තුළ | 500 0 | 600 0 |

21 **ඉඩම්/කුඹුරු/පහත් බිම් ගොඩ කිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)**

- ව. මී. 150 ට අඩු රු. 1,250 සහ එයට වැඩි සෑම ව.මී. 150 කට රු. 750.00 බැගින්

22 **දුරකථන කුළුණු/ ඇන්ටනා කුළුණු ඉදිකිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)**

- උස මීටර් 5 - 20 දක්වා රු. 75,000 ක් සහ වැඩි වන සෑම මීටර් 01 කට රු. 1,000.00 බැගින්

**23.** විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)

- රුපියල් මිලියන 05 කට රුපියල් 4,000 සහ වැඩිවන සෑම රුපියල් මිලියන 1 කට රු. 75.00 බැගින්
- ප්‍රාදේශීය සභා මාර්ගවල දුරකථන කුළුණු / ඇන්ටනා කුළුණු ඉදිකිරීම සඳහා ගාස්තු අයකිරීම
  එක් කණුවක් සඳහා - රු. 2,500.00

24. අනුකූලතා ප්‍රදානය කිරීමේ ගාස්තු (නාගරික නොවන බල ප්‍රදේශ)

- **නේවාසික ඉදිකිරීම් :**
  ව. මීටර් 300 ට අඩු රු. 2,500 සහ ඊට මායිම් වන සෑම ව. මී. 1 ටම රු. 100 බැගින්

- **වානිජ ඉදිකිරීම :**
  ව. මී. 1,000 ට අඩු රු. 2,500 සහ ඊට වැඩිවන සෑම ව. මී. 1 ටම රු. 15 බැගින්

- **මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම :**
  පළමු දික් මීටර් 100 සඳහා රු. 750ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1 ටම රු. 10 බැගින්

- **දුරකථන විදුලි සංදේශ කුළුණු :**
  උස මීටර් 5 -20 දක්වා රු. 1,500 සහ ඊට වැඩි වන සෑම මීටර් 01 ටම රු. 75 බැගින්

25. I. **නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)**

| *විස්තරය* | *නේවාසික වර්ග අඩි 01 රු. ශත* | *ව්‍යාපාරික වර්ග අඩි 01 රු. ශත* |
|---|---|---|
| අත්තිවාරම මට්ටම දක්වා | 10 | 15 |
| බිත්ති මට්ටම දක්වා | 20 | 25 |
| සම්පූර්ණ ඉදිකිරීම | 30 | 35 |
| මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම | 100 | 100 |

II. ඉඩම්/කුඹුරු ගොඩ කිරීම :

සෑම වර්ග මීටර් 150 ටම රු. 5,000 බැගින්

I. දුරකථන/විදුලි සංදේශ කුළුණු :

සෑම උස මීටර් 05 ටම රු. 75,000 බැගින්

II. වැඩිවන මීටරයක් සඳහාම - රු. 1,000.00

26. I. මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත සූර්ය පැනල ඉදිකිරීම සඳහා ගාස්තු අය කිරීම - වර්ග මීටර් 1-1000 දක්වා රු. 25,000.00

| (ඇ) ට්‍රැක්ටරයක ප්‍රමාණයට (කියුබික් මීටර් 1) | 1000-2000 | 300-700 |
| (ඇ) ට්‍රැක්ටරයක ප්‍රමාණය ඉක්මවූවිට | (ආ) හෝ (ඇ) වල ගුණිතය | (අ) සහ (ඇ) වල ගුණිතය |

අපද්‍රව්‍යයේ ස්වභාවය සහ මාරු කිරීමේ හෝ අවසාන බැහැරලීමේ ස්ථානයට ඇති දුර ප්‍රමාණය මත සැබෑ ගාස්තුව පදනම් වේ.

12-163/12

**අම්බලන්ගොඩ නගර සභාව**

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

අම්බලන්ගොඩ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන නගර සභාවේ සභාපති ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා වන මම, (255 වන අධිකාරය) නගර සභා ආඥා පනතේ 160(1) වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මගින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

නගර සභා ආඥා පනතේ 166 වගන්තිය මගින් අම්බලන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ නිවාස, ගොඩනැගිලි, ඉඩම්, ආදියෙහි වාර්ෂික වටිනාකම සඳහා තක්සේරුව 2025 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කල බවත්, එකී තක්සේරුව මත නේවාසික ස්ථාන සඳහා වාර්ෂික වටිනාකමින් 7% (සියයට හතක) සහ වෙළඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරන ස්ථාන සඳහා 11 % ක (සියයට එකොළහක) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2026 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද එකවර හෝ කාර්තු ලෙස සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2026 ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10 % (සියයට දහයක) වට්ටමක්ද, එකී උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ III තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල වරිපනම් බදු මුදල අම්බලන්ගොඩ නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම්, එක් කාර්තුවකට අදාල මුදලින් 5% ක (සියයට පහක) වට්ටමක් ද අම්බලන්ගොඩ නගර සභාවට ලබා දිය යුතු බවට මෙයින් නිවේදනය කරමි.

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

**උපලේඛනය**

| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* |
|---|---|---|
| *කාර්තුව* | *ගෙවිය යුතු දින* | *5 % වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
| 1 කාර්තුව | 2026 මාර්තු 31 ට පෙර | 2026.01.31 |
| 2 කාර්තුව | 2026 ජුනි 30 ට පෙර | 2026.04.30 |
| 3 කාර්තුව | 2026 සැප්තැම්බර් 30 ට පෙර | 2026.07.31 |
| 4 කාර්තුව | 2026 දෙසැම්බර් 31 ට පෙර | 2026.10.31 |

12 - 195/1

---

**අම්බලන්ගොඩ නගර සභාව**

2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

අම්බලන්ගොඩ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන නගර සභාවේ සභාපති ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා වන මම, 255 අධිකාරිය නගර සභා ආඥාපනත ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි.

නගර සභා ආඥාපනතේ 165 ඇ වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාර නගර සභාවේ බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථිර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන යුක්ති සහගත වියදමින් ඒ ඉඩම එකී කාර්යයන් සඳහා සංවර්ධනය කළ හැකි විටෙක එවැනි යම් ඉඩමක,

(*අ*) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, *හෝ*

(*ආ*) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙක, *හෝ*

(*ඇ*) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට හා වගාවන්ට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය සියයට පනහ (50%) ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2026 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට එකක (1%) වාර්ෂික බද්දක් පනවා අය කළ යුතු බවට අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මගින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

12-195/2

---

**අම්බලන්ගොඩ නගර සභාව**

2026 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

(255 අධිකාරිය වන) නගර සභා ආඥාපනතේ 162 වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 163 වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි 1 තීරුවෙහි නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගේම එහි 11 තීරුවෙහි නිරූපිත බද්දක් 2026 වර්ෂයට පනවා අයකළ යුතු බවට අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මගින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

**උපලේඛනය**

| | *1 තීරුව* | *11 තීරුව*<br>*රු. ශත.* |
|---|---|---|
| (i) | මෝටර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක් ,මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ,අත් කරත්තයක් , රික්ෂෝවක්, බයිසිකලයක්, ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25.00 |

| | *I තීරුව* | *II තීරුව* *රු. ශත.* |
|---|---|---|
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ මෝටර් කාර් රථයක් *නැතහොත්* බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් *නැතහොත්* ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා | 10.00 |
| | (*අ*) එය වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් | 10.00 |
| | (*ආ*) එය වෙළඳ කටයුතු නොවන කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් | 5.00 |
| (iii) | සෑම කරත්තයක් සඳහා | 20.00 |
| (iv) | සෑම අත් කරත්තයක් සඳහා | 10.00 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහා | 75.00 |
| (vi) | සෑම පෝනියකු හෝ කොටළුවෙක් සඳහා | 15.00 |
| (vii) | සෑම අලියෙක් සඳහා | 50.00 |

රෝදවල විශ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන , වීල් බැරෝ ,හුදෙක් පුද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා භාවිතා කෙරෙන අත් කරත්ත සහ වෙළඳ කටයුතු සඳහා භාවිතා නොකරන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් කෙරෙයි.

12 - 195/3

---

**අම්බලන්ගොඩ නගර සභාව**

2026 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනත යටතේ අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති විසින් ක්‍රියාත්මක කිරීමට පිළිගෙන එසේම 2017/08/04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2031 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළකරන ලද්දාවූ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තියේ (අ)ඡේදය සමග කියවිය යුතු 261 අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තියේ (1) උපවගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013.05.17 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද, දකුණු පළාතේ නගර සභා බල ප්‍රදේශය තුළ සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අනුව අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් භාවිතා කිරීමට බලය දෙමින්, 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යයන් සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, ලැගුම්හලක් වන විට දී උපලේඛනයේ II තීරුවේ කුමක් සඳහන් වුව ද ඊට අදාළ බලපත්‍ර ගාස්තුව එම හෝටලයේ, ආපන ශාලාවේ, ලැගුම්හලේ 2025 වර්ෂයේ සම්පූර්ණ ආදායමින් 1% ක් විය යුතු බවද, බලපත්‍ර ගාස්තුව නියම කිරීම සඳහා වරලත් ගණකාධිකාරීවරයෙකු විසින් විගණනය කොට සනාථ කරන ලද අදාල ආයතනයේ 2026 වර්ෂයේ ගිණුම් ප්‍රකාශය අයිතිකරු, කළමනාකරු හෝ වෙනත් බලයලත් අයෙකු විසින් වර්ෂයක් පාසා අම්බලන්ගොඩ නගර සභාවට ඉදිරිපත් කළ යුතු බවටත් 2026.03.31 දිනට ප්‍රථම අදාළ පරිශ්‍රය සඳහා බලපත්‍ර ලබා ගත යුතු බවට අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මගින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

**උපලේඛනය**

<table>
<tr><th colspan="3">I තීරුව</th><th colspan="3">II තීරුව</th></tr>
<tr><th colspan="3" rowspan="2">බලපත්‍රයේ ස්වභාවය</th><th colspan="3">ස්ථානයේ වාර්ෂික වටිනාකම</th></tr>
<tr><th>රු.750ට වැඩි නොවන විට<br>රු. ශත</th><th>රු.750 සිට රු.1,500 දක්වා<br>රු. ශත</th><th>රු.1,500 ට වැඩිවන විට<br>රු. ශත</th></tr>
<tr><td>01</td><td colspan="2">මාළු විකිණීම</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>02</td><td colspan="2">මස් විකිණීම</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>03</td><td colspan="2">සිසිල් බීම කර්මාන්ත ශාලා</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>04</td><td colspan="2">කොණ්ඩා කැපීමේ ස්ථාන, බාබර්සාප්පු, සැලූන්හල් සහ රූපලාවන්‍යාගාර</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>05</td><td colspan="2">බේකරි</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>06</td><td colspan="2">කිරි පට්ටි</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>07</td><td colspan="2">පිහිණුම් තටාක</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>08</td><td colspan="2">අයිස් කර්මාන්තශාලා</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>09</td><td colspan="2">බත්කඩ, ආපනශාලා, තේ හා කෝපි කඩ</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>10</td><td colspan="2">හෝටල්</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>11</td><td colspan="2">නවාතැන් පොළවල්</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>12</td><td colspan="2">ලොන්ඩරි</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>13</td><td colspan="2">කර්මාන්ත ශාලා</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>14</td><td colspan="2">අවමංගල්‍ය සේවා සැපයීම</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>15</td><td colspan="2">සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>16</td><td colspan="2">ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන</td><td>500 0</td><td>750 0</td><td>1,000 0</td></tr>
<tr><td>17</td><td colspan="5">අන්තරාදායක ව්‍යාපාර :</td></tr>
<tr><td rowspan="12"></td><td>i.</td><td>වෙල්ඩින් වැඩපලක් හෝ ග්‍රිල් වැඩපලක් පවත්වාගෙන යාම</td><td rowspan="12">500 0</td><td rowspan="12">750 0</td><td rowspan="12">1,000 0</td></tr>
<tr><td>ii.</td><td>බලවේග යන්ත්‍ර මඟින් නූල් නිෂ්පාදනය කිරීමේ, පුළුන් සකස් කිරීමේ හා රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම</td></tr>
<tr><td>iii.</td><td>කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් සිමෙන්ති භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම</td></tr>
<tr><td>iv.</td><td>සිමෙන්ති බ්ලොක්ගල්, මල්පෝච්චි, බීරලු නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම</td></tr>
<tr><td>v.</td><td>වායුසමීකරණ යන්ත්‍ර හා ශීතකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම</td></tr>
<tr><td>vi.</td><td>පොහොර වර්ග, කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම, සත්ව ආහාර වර්ග නිපදවීම, ගබඩා කර තැබීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම</td></tr>
<tr><td>vii.</td><td>ගල්වලක් හෝ අතින් ගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම</td></tr>
<tr><td>viii.</td><td>වී පාහින මෝලක් පවත්වාගෙන යාම</td></tr>
<tr><td>ix.</td><td>ගුවන් විදුලියන්ත්‍ර, රූපවාහිනි යන්ත්‍ර, වීඩියෝ කැමරා, ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම</td></tr>
<tr><td>x.</td><td>ලී මෝලක් පවත්වාගෙන යාම</td></tr>
<tr><td>xi.</td><td>ස්වර්ණාභරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම</td></tr>
<tr><td>xii.</td><td>බැටරි චාජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම</td></tr>
</table>

| I තීරුව | | | II තීරුව | | |
|---|---|---|---|---|---|
| | | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| බලපත්‍රයේ ස්වභාවය | | | රු.750ට වැඩි නොවන විට රු. ශත | රු.750 සිට රු.1,500 දක්වා රු. ශත | රු.1,500 ට වැඩිවන විට රු. ශත |
| | xiii. | බිම් මල් නිපදවීමේ, පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xiv. | ආයුර්වේද වෛද්‍ය චිකිත්සක මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම | | | |
| | xv. | බටහිර වෛද්‍ය ප්‍රතිකාර කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | | | |
| | xvi. | වානේ වැහි පීලි නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | | | |
| | xvii. | යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වා ගෙන යාම | | | |
| | xviii. | ත්‍රීරෝද රථ, මෝටර්සයිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xix. | මෝටර් රථ අලුත්වැඩියා කිරීම (ගරාජයක්) ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xx. | වානේ ගෘහ භාණ්ඩ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xxi. | සත්ව ආහාර වර්ග ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| | xxii. | ත්‍රීරෝද රථ, මෝටර් සයිකල් සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xxiii. | වාහන,යතුරු පැදි, ත්‍රීරෝද රථ, පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xxiv. | වෛද්‍ය රසායනාගාරයක් (ලේ හා මුත්‍රා ඇතුළු සාම්පල් පරීක්ෂා කිරීම) පවත්වාගෙන යාම | | | |
| | xxv. | දන්ත චිකිත්සාගාරයක්, දත් බඳින ස්ථානයක් ,එක්ස්රේ යන්ත්‍රයක් පවත්වාගෙන යාම | | | |
| | xxvi. | පශු වෛද්‍ය ගිලන්හලක් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | | | |

*අප්‍රසන්න ව්‍යාපාර :*

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1. | කුල්ස්පොට් එකක් හා කිරිහලක් හෝ ස්නැක් බාර් එකක් පවත්වාගෙන යාම | | | |
| | 2. | බිත්තර සිල්ලරට හෝ තොග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | 3. | රසකැවිලි නිපදවීම, කේක් වර්ග නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | | | |
| | 4. | පපඩම් හෝ නූඩ්ල්ස් නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | | | |
| | 5. | අයිස්ක්‍රීම්, යෝගට්, බීම පැකට් නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| | 6. | ජෑම්, සිරප්, සෝස් වර්ග, නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | 7. | කරවල, ජාඩි වේලීම, විකිණීමේ හෝ ගඩඩා කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | 8. | කුරුඳු තැලීමේ ස්ථානයක් හා කුරුඳු තෙල් මඩුවක් පවත්වාගෙන යාම | | | |

| *I තීරුව* | | | *II තීරුව* | | |
|---|---|---|---|---|---|
| *බලපත්‍රයේ ස්වභාවය* | | | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | | *රු.750ට වැඩි නොවන විට රු. ශත* | *රු.750 සිට රු.1,500 දක්වා රු. ශත* | *රු.1,500 ට වැඩිවන විට රු. ශත* |
| | 9. | ඔසු පැන් හලක්, කොළ කැද හෝ බැදපු කඩල, රටකජු, (වේස්ට් කඩල) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | 10. | පානීය ජලය බෝතල් ගත කර ගබඩා කරතැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | 11. | ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම | | | |
| | 12. | කුකුලන් 100 ට අඩු කුකුල් කොටුවක් පවත්වා ගෙන යාම | | | |
| | 13. | කුකුලන් 100 ට වැඩි කුකුල් කොටුවක් පවත්වා ගෙන යාම | | | |
| | 14. | ඌරන් 25 ට අඩු ඌරු කොටුවක් පවත්වා ගෙන යාම | | | |
| | 15. | ඌරන් 25 ට වැඩි ඌරු කොටුවක් පවත්වා ගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| | 16. | එළදෙනුන් 25 ට අඩු ඇති කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | | | |
| | 17. | එළදෙනුන් 25 ට වැඩි ඇති කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | | | |
| | 18. | පිසින ලද ආහාර සකස් කර සපයන ස්ථානයක් (කේටරින්) පවත්වාගෙන ගෙන යාම | | | |
| | 19. | නරක් විය හැකි ආහාර වර්ග, කුළු බඩු තොග හා සිල්ලරට විකිණීම | | | |
| | 20. | පොල් තෙල් මෝලක් පවත්වා ගෙන යාම | | | |
| | 21. | ශීත කල මස් හෝ මාළු ගබඩා කර තැබීම | | | |
| | 22. | මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තැබීම | | | |

*අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර :*

| | | | | | |
|---|---|---|---|---|---|
| | i. | මිරිස්, ධාන්‍ය වර්ග, පිටි ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | | | |
| | ii. | ෆයිබර් ග්ලාස් වැඩපලක් පවත්වාගෙන යාම | | | |
| | iii. | කොහු මෝලක් පවත්වාගෙන යාම | | | |
| | iv. | පොල්ලෙලි හා දැව පල්කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | v. | හුණු වැරටි පිළිස්සීම සඳහා පෝරණුවක් පවත්වාගෙන යාම | | | |
| | vi. | හම් වර්ග පදම් කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | | | |
| | vii. | රබර් බුෂ් සාදන වැඩපලක් පවත්වා ගෙන යාම | | | |
| | viii. | රබර් දුම් ගෙයක් පවත්වා ගෙන යාම | | | |
| | ix. | ගිනිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා නිපදවීම, විකිණීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| | x. | වාහන ගෑස් කිරීම හෝ ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xi. | ගෑස් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | | | |
| | xii. | රෙදි පින්තාරු කිරීමේ ස්ථානයක් (බතික් වැඩපලක්) පවත්වාගෙන යාම | | | |
| | xiii. | මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xiv. | සබන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xv. | ලෝහ භාණ්ඩ නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xvi. | පිත්තල භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |

| I තීරුව | | | II තීරුව | | |
|---|---|---|---|---|---|
| | | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| බලපත්‍රයේ ස්වභාවය | | | රු.750ට වැඩි නොවන විට රු. ශත | රු.750 සිට රු.1,500 දක්වා රු. ශත | රු.1,500 ට වැඩිවන විට රු. ශත |
| | xvii. | ටයර් ටියුබ් වෝල්කනයිසින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| | xviii. | අළුත් හෝ පරණ ටයර් ටියුබ් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xix. | කොප්පරා නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xx. | අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක්) පවත්වාගෙන යාම | | | |
| | xxi. | වාහන ගාල් කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xxii. | පොල්තෙල් හෝ වෙනත් තෙල් වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xxiii. | මෝටර් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| | xxiv. | ටයර් සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |

12-195/4

---

**අම්බලන්ගොඩ නගර සභාව**

2026 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

අම්බලන්ගොඩ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නගර සභාවේ සභාපති ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා වන මා හට, 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 165 අ (1) වගන්තිය මඟින් ලැබී ඇති බලතල අනුව අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බද්දක්, 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරමි. ඒ අනුව කර්මාන්ත බද්දට යටත් කර්මාන්ත 2026.03.31 දිනට පෙර අදාල බද්ද ගෙවිය යුතු බවට අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මඟින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

**උපලේඛනය**

| | *I තීරුව* *කර්මාන්තයේ ස්වභාවය* | *II තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු.750 ට වැඩි නොවන විට* *රු. ශත* | *රු.751 සිට රු.1,500 දක්වා* *රු. ශත* | *රු.1,500 ට වැඩි වන විට* *රු. ශත* |
| 01. | ලියවන පට්ටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | සම්භාණ්ඩ නිෂ්පාදන | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | සපත්තු නිෂ්පාදන | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | පින්තූර රාමු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | පාපැදි අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | රබර් සීල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | ස්වර්ණාභරණ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | වාත්තු වැඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කොහු භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ෆයිබර් ග්ලාස් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | බෙලෙක් වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | කම්මල | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ගෑස් උපකරණ අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ඔරලෝසු අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |

12-195/5

---

**අම්බලන්ගොඩ නගර සභාව**

2026 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

අම්බලන්ගොඩ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන නගර සභාවේ සභාපති ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා වන මා හට, 255 අධිකාරිය නගර සභා ආඥා පනතේ 184 අ වගන්තිය සමඟ කියවිය යුතු 165 ආ (1) උපවගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන පහත උපලේඛනයේ I තීරුවේ දැක්වෙන ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන් ම එම ව්‍යාපාරයේ 2025 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි II තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි. ඒ අනුව ව්‍යාපාර බද්දට යටත් ව්‍යාපාර 2026.03.31 දිනට පෙර අදාල බද්ද ගෙවිය යුතු බවට අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මගින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

**උපලේඛනය**

| *I තීරුව* | | *II තීරුව* | | | | |
|---|---|---|---|---|---|---|
| *ව්‍යාපාරයේ ස්වභාවය* | | *පසුගිය වර්ෂයේ ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම්* | | | | |
| | | *රු.6,000 සිට රු.12,000 දක්වා* | *රු.12,001 සිට රු. 18,750 දක්වා* | *රු. 18,751 සිට රු. 75,000 දක්වා* | *රු.75,001 සිට රු.150,000 දක්වා* | *රු.150,000ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| | *(අ)* | | | | | |
| 01. | අමතර කොටස් වෙළඳ (රථවාහන, යන්ත්‍ර සූත්‍ර) | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 02. | අලෙවි නියෝජිත ආයතන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ඇ) | | | | | |
| 03. | ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 04. | ඇළුමිනියම්/ ප්ලාස්ටික්/මැටි බඩු/පිත්තල වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 05. | ඇස් කණ්නාඩි | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 06. | ඇඳුම් මැසීමේ ස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ඉ) | | | | | |
| 07 | ඉංග්‍රීසි/ආයුර්වේද බෙහෙත්ශාලා | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 08. | ඉන්ධන සැපයුම් මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 09. | ඉදිකිරීම් උපකරණ කුළියට දීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (උ) | | | | | |
| 10. | උකස් මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 11. | උත්සව ශාලාවක් පවත්වාගෙන යාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 12. | උත්සව භාණ්ඩ කුලියට දීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (එ) | | | | | |
| 13. | එළවළු පළතුරු වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ඔ) | | | | | |
| 14. | ඔරලෝසු වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ක) | | | | | |
| 15. | කායවර්ධන මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 16. | කාර්යාල පවත්වාගෙන යාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 17. | ක්‍රීඩා භාණ්ඩ අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 18. | කුරුඳු වෙළඳ මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 19. | කාර්මික භාණ්ඩ කුළියට දීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 20. | කුෂන් වැඩ | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 21. | කේටරින් ස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 22. | කේක් නිර්මාණ අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 23. | කුරුඳු ගබඩා | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 24. | කුළුබඩු අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 25. | ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |

| I තීරුව | | II තීරුව | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපාරයේ ස්වභාවය | | පසුගිය වර්ෂයේ ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම් | | | | |
| | | රු.6,000 සිට රු.12,000 දක්වා | රු.12,001 සිට රු. 18,750 දක්වා | රු. 18,751 සිට රු. 75,000 දක්වා | රු.75,001 සිට රු.150,000 දක්වා | රු.150,000ට වැඩි |
| | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| | (ග) | | | | | |
| 26. | ගබඩා | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 27. | ගුවන් ටිකට් පත් අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 28 | ග්‍රොසරි | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 29. | ගෘහ භාණ්ඩ හා උපකරණ අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ඡ) | | | | | |
| 30. | ඡායා පිටපත් හා ලැමිනේටින් /අන්තර්ජාල පහසුකම් සැපයීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 31. | ඡායාරූපගාර | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 32. | ජෝතිෂ්‍ය කාර්යාල | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ට) | | | | | |
| 33. | ටයර් හා ටියුබ් වෙළඳාම හා අලුත්වැඩියාව | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 34. | ටේලර් සාප්පු | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 35. | ටියුටරි (උපකාරක පංති) | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ඩ) | | | | | |
| 36. | ඩී.ජේ.උපකරණ කුළියට දීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ත) | | | | | |
| 37. | තොග හා සිල්ලර වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 38. | තුරඟ තරග සීට්ටු මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 39. | තීන්ත අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 40. | තැපැල් නියෝජිත කාර්යාල | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 41. | තේකොළ අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ද) | | | | | |
| 42. | දන්ත ශල්‍යාගාර | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 43. | දුරකතන සේවා මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 44. | දුරකතන අලෙවිය/අළුත්වැඩියාව | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 45. | දේපළ වෙළඳාම් | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 46. | ධීවර ආම්පන්න හා ආශ්‍රිත උපකරණ වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (න) | | | | | |
| 47. | නිමි ඇඳුම් | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 48. | නිවාස සැලසුම් නිර්මාණ ඇඳීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ප) | | | | | |
| 49. | පරිගණක හා උපාංග වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 50. | පරණ යකඩ බඩු මිලදී ගැනීම/විකිණීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 51. | පර්සල් ලිපිද්‍රව්‍ය බෙදාහැරීමේ සේවා (පෞද්ගලික) | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |

| I තීරුව | | II තීරුව | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපාරයේ ස්වභාවය | | පසුගිය වර්ෂයේ ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම් | | | | |
| | | රු.6,000 සිට රු.12,000 දක්වා | රු.12,001 සිට රු. 18,750 දක්වා | රු. 18,751 සිට රු. 75,000 දක්වා | රු.75,001 සිට රු.150,000 දක්වා | රු.150,000ට වැඩි |
| | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 52. | පාවහන් අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 53. | පාසල් පොත්, ලිපිද්‍රව්‍ය හා පුවත්පත් වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 54. | පැළ තවාන් | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 55. | පින්තූර රාමු කිරීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 56. | පුහුණු මධ්‍යස්ථාන (දේශීය /විදේශීය) | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 57. | පූජා භාණ්ඩ අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 58. | පුද්ගලික පාසල් | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 59. | පෞද්ගලික රථගාල් | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 60. | පෞද්ගලික රෝහල් | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 61. | පෞද්ගලික ප්‍රවාහන සේවා | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 62. | ප්‍රචාරණ මාධ්‍ය ලබා දෙන ස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 63. | ප්‍රදර්ශනාගාර | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 64. | පාවහන් අළුත්වැඩියා කිරීමේ ස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 65. | ප්‍රවාහන පහසුකම් සැපයීමේ ස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 66. | පාරිභෝගික භාණ්ඩ ඇසුරුම් කිරීම හා විකිණීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (බ) | | | | | |
| 67. | බැංකු, රක්ෂණ, මූල්‍ය ආයතන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 68. | භාණ්ඩ කුළියට දීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 69. | බෑග් හා සම් භාණ්ඩ විකිණීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 70. | බතික් නිර්මාණ සැකසීම හා විකිණීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 71. | බැටරි අලෙවි කිරීමේ ස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 72. | බයිට් වර්ග විකිණීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 73. | බෝට්ටු සවාරි සේවා | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ම) | | | | | |
| 74. | මත්පැන් විකිණීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 75. | මුද්‍රණාල | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 76. | මැටි භාණ්ඩ වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 77. | මුළුතැන්ගෙයි උපකරණ වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 78. | මීමැසි පෙට්ටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ර) | | | | | |
| 79. | රථවාහන, යතුරු පැදි වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 80. | රියදුරු පුහුණු පාසල් | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 81. | රෙදි වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |

| I තීරුව | | II තීරුව | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපාරයේ ස්වභාවය | | පසුගිය වර්ෂයේ ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම් | | | | |
| | | රු.6,000 සිට රු.12,000 දක්වා | රු.12,001 සිට රු. 18,750 දක්වා | රු. 18,751 සිට රු. 75,000 දක්වා | රු.75,001 සිට රු.150,000 දක්වා | රු.150,000ට වැඩි |
| | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| | (ල) | | | | | |
| 82. | ලිහිසි තෙල් වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 83. | ලී වෙළඳ සැල් | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 84. | ලොතරැයි විකිණීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ව) | | | | | |
| 85. | වාහන දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 86. | වාහන සේවා ස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 87. | වාහන කුළියට දීමේ ස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 88. | වීදුරු වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 89. | විදුලි උපකරණ වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 90. | විදේශ මුදල් හුවමාරු මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 91. | විදේශ රැකියා නියෝජිත ආයතන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 92. | විසිතුරු භාණ්ඩ අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 93. | විශේෂඥ වෛද්‍ය සේවා සැපයීමේ මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 94. | වෙස් මුහුණු වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 95. | වෙළඳ ප්‍රචාරණ කටයුතු කිරීමේ නියෝජිත ආයතන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ස) | | | | | |
| 96. | සංගීත තැටි/වීඩියෝ තැටි අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 97. | සංචාරක බෝට්ටු සේවයක් පවත්වාගෙන යාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 98. | සංගීත භාණ්ඩ අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 99. | සත්ව චිකිත්සාගාර | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 100. | ස්වර්ණාභරණ වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 101. | සාප්පු බඩු වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 102. | සිනමා ශාලා | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 103. | සිහිවටන සෑදීම හා විකිණීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 104. | සුපිරි වෙළඳසැල් | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 105. | සිගරැට් අලෙවි නියෝජිත | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 106. | සුරතල් මසුන්, පක්ෂීන් වෙළඳාම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 107 | සෝයා අයිස්ක්‍රීම් අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 108 | හාඩ්වෙයාර් (ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම) | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 109 | හඳුන්කූරු අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ළ) | | | | | |
| 110 | ළදරු පාසල්/දිවා සුරැකුම් මධ්‍යස්ථාන | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |

| I තීරුව | | II තීරුව | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපාරයේ ස්වභාවය | | පසුගිය වර්ෂයේ ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම් | | | | |
| | | රු.6,000 සිට රු.12,000 දක්වා | රු.12,001 සිට රු. 18,750 දක්වා | රු. 18,751 සිට රු. 75,000 දක්වා | රු.75,001 සිට රු.150,000 දක්වා | රු.150,000ට වැඩි |
| | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 111 | (ශ) | | | | | |
| | ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| | (ෆ) | | | | | |
| 112 | ෆාමසි/ආයුර්වේද බෙහෙත් බඩු අලෙවිය | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 113 | වෙනත් ව්‍යාපාර | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |
| 114 | අන්තර්ජාලය හරහා භාණ්ඩ විකිණීම හා සේවා සැපයීම | 90 0 | 180 0 | 360 0 | 1,200 0 | 3,000 0 |

වානිජ බැංකුවලින් ව්‍යාපාර බදු අය කිරීමේ දී විවිධ නිර්ණායක ඔස්සේ ව්‍යාපාර බදු අය කරන අතර ඒ සඳහා පහත පනත් ද සැලකිල්ලට ගනු ලැබේ.

1. 1988 අංක 30 දරන පනත යටතේ බැංකු සේවාවක් පවත්වාගෙන යාම
2. 1942 අංක 13 දරන උකස්ගන්නන් පිළිබඳ ආඥාපනත යටතේ උකස් ගැනීම
3. 2006 අංක 56 දරන මූල්‍ය කල් බදු පනත යටතේ කල්බදු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
4. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ මුදල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
5. විද්‍යුත් මූල්‍ය ගනුදෙනු පවත්වාගෙන යාම

12-195/6

---

## අම්බලන්ගොඩ නගර සභාව

### 2026 වර්ෂයට අදාළව ප්‍රචාරණ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු පැනවීම

නගර සභා පනතේ 153 හා 157 වගන්ති යටතේ අම්බලන්ගොඩ නගර සභාව මගින් සම්පාදිත, එම ආඥාපනතේ 154 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රචාරණ, දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ 2026 වර්ෂය සඳහා පහත දැක්වෙන උපලේඛන අනුව බලපත්‍ර ගාස්තුවක් අය කිරීමටත් දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර අනුමැතිය ලබා නොගත් හෝ අනුමැතියකින් තොරව ප්‍රදර්ශනය කළ ප්‍රචාරණ පුවරු සඳහා පසුව මුදල් ගෙවීමට පැමිණෙන අවස්ථාවලදී අමතර දඩ මුදලක් වශයෙන් ප්‍රදර්ශනය කරන දැන්වීම්වල ගාස්තුවෙන් 25%ක මුදලක් අය කළ යුතු බවට අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මගින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

**උපලේඛනය**

| තාවකාලික දැන්වීම් | රු. ශත |
|---|---|
| සති 01 දක්වා තාවකාලික දැන්වීම් සඳහා - වර්ග අඩියකට | 100 0 |
| සති 01 -02 දක්වා තාවකාලික දැන්වීම් සඳහා - වර්ග අඩියකට | 150 0 |
| සති 02- මාස 01 දක්වා තාවකාලික දැන්වීම් සඳහා - වර්ග අඩියකට | 200 0 |
| මාස 03 ක කාලයක් දක්වා තාවකාලික දැන්වීම් සඳහා - වර්ග අඩියකට | 250 0 |
| තාවකාලිකව ප්‍රදර්ශනය කරනු ලබන කොඩි කණුවක් සඳහා - දිනකට | 100 0 |
| ස්ථිර දැන්වීම් | |
| මාස 06 ක කාලයක් සඳහා ස්ථිර දැන්වීමක් - වර්ග අඩියකට | 325 0 |
| අවුරුද්දක කාලයක් සඳහා ස්ථිර දැන්වීම් සඳහා - වර්ග අඩියකට | 400 0 |
| LED දැන්වීම් පුවරු සඳහා අවුරුද්දක කාලයකට - වර්ග අඩියකට | 1,000 0 |

12-195/7

---

**අම්බලන්ගොඩ නගර සභාව**

2026 වර්ෂයට අදාළව පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනත මගින් ලැබී ඇති බලතල අනුව සහ 2022 ජනවාරි මස 27 දින අංක 2264/18 දරන ගැසට් නිවේදනය පරිදි පහත I උපලේඛනයෙහි සඳහන් කර්මාන්ත සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතුය. එකී බලපත්‍රයේ වලංගු කාලය වර්ෂ 3කි. එකී බලපත්‍රය ලබා ගැනීම සඳහා අයකරනු ලබන පරීක්ෂණ ගාස්තු II උපලේඛනයේ ද බලපත්‍ර ගාස්තු III උපලේඛනයෙහි ද දක්වා ඇති අයුරින් අය කළ යුතු බවට අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මගින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

01. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
02. සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
03. සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
04. රෙදි වියන යන්ත්‍ර / මැෂින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීම් හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
05. දිනකට ලීටර 200 ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත වාණිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
06. පොල් තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර 10 ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
07. දිනකට ලීටර 100 ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හා බොතල්ගත කිරීමේ කර්මාන්ත
08. දිනකට කිලෝ ග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවයක් සහිත වියළි නිෂ්පාදන සැකසුම් සහිත වී මෝල්
09. මසකට කිලෝ ග්‍රෑම් 1000 අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත

11. එක් තොගයකට කිලෝ ග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවයක් සහිත සල්ෆර් දුම්ගැසීම සහිත කුරුඳු දුම්ගැසීමේ කර්මාන්ත.
12. සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ / මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 ට හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝ ග්‍රෑම් 250 ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවයක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 5 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50 ට අඩු සංඛ්‍යාවක් සිටි එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු සංඛ්‍යාව 100 ක් හෝ ඊට වැඩි සහ 500 ට වැඩි සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්
20. ගබඩා ධාරිතාවය ඝන මීටර 100 හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසැරි කර්මාන්ත
22. යන්ත්‍රානුසරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙ.ටොන් 20 ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5 ට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුත්කව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස් අමු ද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය සහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය තැනීම් කටයුතු
30. දිනකට ඝන මීටර 25 ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිත කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 5 ට හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව 25 ක් හෝ ඊට වැඩි සහ 100 ට අඩු පුද්ගලයින් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්
35. විසිර පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම් නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අළුත්වැඩියා කිරීම් නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල්තබා ගැනීමට සකස් කිරීම් සහිත මල් ශාලා
39. මෙම උපලේඛනයේ ඇ කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනම ක්‍රියාකාරකමක් / කර්මාන්තයක්

## II උපලේඛනය

| *ආයෝජන මුදල (රුපියල්)* | *පරික්ෂණ ගාස්තු*<br>*රු.* |
|---|---|
| 250,000/- ට අඩු | 3,000/- |
| 250,001/- සිට 500,000/- | 3,750/- |
| 500,001/- සිට 1,000,000/- | 5,000/- |
| 1,000,000/- ට වැඩි | 10,000/- |

**III උපලේඛනය**

| | *ගාස්තු රු.* |
|---|---|
| පාරිසරික බලපෑම් හඳුනාගැනීම පිළිබඳ ප්‍රශ්නාවලිය | 100/- |
| පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම් පත්‍රය | 200/- |
| පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අලුත්කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය | 100/- |
| පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු | 4,500/- |

12-195/8

---

**අම්බලන්ගොඩ නගර සභාව**

2026 වර්ෂයට අදාළව ත්‍රී රෝද රථ නවතා තැබීමේ බලපත්‍ර ගාස්තු

නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 153 සහ 157 වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභාව විසින් සාදනු ලැබ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලය ප්‍රකාර දකුණු පළාත් සභාවේ නීතිය හා සාමය, අධ්‍යාපන, මහා මාර්ග, ප්‍රවෘත්ති, වතු යටිතල පහසුකම් හා පාරිසරික කටයුතු විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවට අනුව සභාපති වරයා හෝ ලේකම්වරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයේ ඇත්නම් මිස යම් තැනැත්තෙකු විසින් නගර සභාව විසින් නියම කරන ලද ත්‍රී රෝද රථ නවතා තැබීමේ බලපත්‍ර ස්ථානයක ත්‍රී රෝද රථ නවතා තැබීම නොකළ යුතු අතර වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. 1,000/= අය කිරීම කළ යුතු බවට අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මගින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

12-195/9

---

**අම්බලන්ගොඩ නගර සභාව**

2026 වර්ෂයට අදාළව විනෝද බදු පැනවීම

1984 අංක 37 දරන විනෝද බදු පනතේ සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සහ ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 176 වැනි අධිකාරියේ 3 වගන්තිය විධිවිධාන පරිදි, අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මගින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

2026 වර්ෂයට පහත උපලෙබනයේ සඳහන් පරිදි බදු පැනවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජනයේ අංක 2456/27 හා 2025.09.30 දිනැති *ගැසට් පත්‍රය* ප්‍රකාරව විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය වීම තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

**උපලේඛනය**

අම්බලන්ගොඩ නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන යම් විනෝද කටයුත්තක් සඳහා ගාස්තුව

| | | |
|---|---|---|
| සිනමා ශාලාවලින් | - | 10% ක් ද |
| අනෙකුත් විනෝද කටයුතුවලින් | - | 12.5% ක් ද  වශයෙන් අය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. |

12-195/10

---

**අම්බලන්ගොඩ නගර සභාව**

ව්‍යාපාරික ස්ථානවල කසළ බැහැර කිරීමේ ගාස්තු - 2026

අම්බලන්ගොඩ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නගර සභාවේ සභාපති ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා වන මා හට 255 අධිකාරිය නගර සභා ආඥාපනත සමග කියවිය යුතු 165 ආ (1) උප වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ව්‍යාපාරික ස්ථානවල දෛනිකව එකතුවන කසළ සඳහා ගාස්තුවක් අය කිරීමට අම්බලන්ගොඩ නගර සභාවේ 2025.10.07 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ අංක 05.01.09 දරන යෝජනාව මගින් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1834 හා 2013.10.25 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද, දකුණු පළාතේ, පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 1886/12 හා 2014.10.28 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද, දකුණු පළාතේ, නගර සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමට 2016.05.02 දින තීරණ අංක 69 යටතේ තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එමෙන්ම අංක 05.01.01.06 හා 2022/12/06 දිනැති සභා තීරණය මගින් කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගාස්තුවක් අය කිරීම සුදුසු බව තීරණය කර ඇති අතර අංක 2024/03/26/131 හා 2024.03.06 දිනැති ලේකම් තීරණය අනුව ව්‍යාපාරයේ ස්වභාවය අනුව මාසිකව කසළ ගාස්තු අය කිරීම සුදුසු බව තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව ව්‍යාපාරයේ ස්වභාවය අනුව ගාස්තු අය කිරීම පහත පරිදි වේ.

| *අනු. අංකය* | *ආයතන වර්ගය* | *මාසික කසළ ගාස්තුව (රු.)* |
|---|---|---|
| 01. | පළතුරු අලෙවිසැල් | 2,500 |
| 02. | ෆුඩ් සිටි | 5,000 |
| 03. | පුද්ගලික හෝටල් | 5,000 |
| 04. | හෝටල් | 2,500 |
| 05. | පුද්ගලික අධ්‍යාපන ආයතන | 2,500 |
| 06. | රෙදිපිළි අලෙවිසැල් | 2,500 |
| 07. | සුපිරි වෙළඳසැල් | 2,500 |
| 08. | තොග හා සිල්ලර වෙළඳසැල් | 1,250 |
| 09. | නවාතැන්පොළ | 1,250 |
| 10. | ධීවර වරාය | 15,000 |

ගොඩහේවා අසේල ප්‍රසන්න ගොඩහේවා,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ.

12-195/11